2025

වාර්ෂික කාර්ය සාධන වාර්තාව
வருடாந்த செயற்றிறன் அறிக்கை
Annual Performance Report

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

වාර්ෂික කාර්යසාධන වාර්තාව 2025

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

නො.163, කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ,
කොළඹ 05.

2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය: 210

2020.01.30 දින රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලද ආකෘති පත්‍රය ප්‍රකාරව මෙම වාර්තාව සකස් කොට ඇත.

අන්තර්ගතය

	පටුන	පිටුව
පරිච්ඡේදය 01 -	ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	07 - 18
පරිච්ඡේදය 02 -	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	19 - 26
පරිච්ඡේදය 03-	වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	27 - 48
පරිච්ඡේදය 04-	කාර්ය සාධන දර්ශක	49 - 52
පරිච්ඡේදය 05 -	තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	53 - 58
පරිච්ඡේදය 06 -	මානව සම්පත් පැතිකඩ	59 - 62
පරිච්ඡේදය 07-	අනුකූලතා වාර්තාව	63 - 73
	අවසානය	74 – 76

01 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.3. ප්‍රධාන කාර්යයන්

1.4. සංවිධාන සටහන

1.5. දෙපාර්තමේන්තුවේ අංශ / ඒකක

1.6. දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල්

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

1.0 රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

1.1 හැඳින්වීම

බ්‍රිතාන්‍ය යටත් විජිතවාදී පාලන සමයේ දෙවන ලෝක යුද්ධ කාල පරිච්ඡේදයේදී යුද තොරතුරු පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා “War Information Centre” නමින් ආයතනයක් ක්‍රියාත්මක විය.

සෝල්බරි කොමිෂන් සභාවේ උපදෙස් හා නිර්දේශ මත ලෝක යුද්ධය නිමා වීමත් සමඟ යුද තොරතුරු මධ්‍යස්ථානය, රජයේ සංවර්ධන කාර්භාරය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා “රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව” නමින් නව ආයතනයක් ලෙස 1948 ජූලි මස 31 වැනිදා කොළඹ ගාලු මුවදොර මහලේකම් කාර්යාල සංකීර්ණයේ දී ස්ථාපනය කෙරිණ. ආරම්භයේදී රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,

1. ප්‍රවෘත්ති සැපයීම් අංශය
2. ආණ්ඩුවේ පොත්පත් ආයතනය
3. ආණ්ඩුවේ චිත්‍රපට අංශය

යන අංශ තුනෙන් සමන්විත විය.

රජය ඉටු කරන ජාතික සංවර්ධන කාර්යභාරය ජනතාව අතරට ගෙන යාම සඳහා ප්‍රධාන කාර්යයන් තුනක් මුල් කරගෙන, මෙකී ප්‍රධාන අංශ තුන යටතේ ස්ථාපිත රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ එම ප්‍රධාන කාර්යයන් වූයේ,

01. රජයේ සංවර්ධන ප්‍රවෘත්ති හා ප්‍රචාරක කටයුතු මෙහෙයවීම
02. රජයේ නිල ප්‍රකාශන ජනතාව අතරට ගෙනයාම (මුද්‍රණය හා බෙදා හැරීම)
03. රජය ඉටු කරන ජාතික සංවර්ධන කාර්යභාරය පිළිබඳව ගම් මට්ටමින් ජනතාව දැනුවත් කිරීම සඳහා රජයේ චිත්‍රපට අංශය විසින් වාර්තා චිත්‍රපට නිපදවා ප්‍රදර්ශනය කිරීම

යනාදියයි.

ගාලු මුවදොර මහලේකම් කාර්යාල සංකීර්ණයේ සිට ආයතනයේ එක් එක් අංශ වරින්වර විවිධ ස්ථානවල ස්ථාපනය කර තිබේ. ඒ අතර ජාවත්ත වාරිමාර්ග දෙපාර්තමේන්තු ගොඩනැඟිල්ල, මොරටුව පොල්වත්තේ වෙලෝනා ගොඩනැඟිල්ල, කොටුව ට්‍රාන්ස්වර්ක් මන්දිරය, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ අතපත්තු ගොඩනැඟිල්ල දැක්විය හැකිය. 90 දශකයේ දී කොල්ලුපිටිය පෞද්ගලික ගොඩනැඟිල්ලක මහල් දෙකක පවත්වාගෙන ගිය රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව එවකට රජයේ චිත්‍රපට අංශය පවත්වා ගෙන ගිය පොල්හේන්ගොඩ පරිශ්‍රයට එනම් වත්මන් පරිශ්‍රයම තුළට ගෙනැවිත්

තිබේ. එතැන් සිට මෙම පරිශ්‍රයේ නව ගොඩනැඟිලි ඉදිකරමින් ආයතනයේ සියලු අංශ එක් පරිශ්‍රයක සිට ක්‍රියාත්මක කිරීමට ආයතන ප්‍රධානීන් කටයුතු කර ඇත.

මෙකී කාර්යභාරය ඉටු කිරීම සඳහා පළපුරුදු, දක්ෂ ජනමාධ්‍යවේදියෙකු මෙන්ම පුවත්පත් කතුවරයෙකු වූ එච්.ඒ.ජේ. හුළුගල්ල මහතා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ප්‍රවෘත්ති නිලධාරියා ලෙස පත් කරනු ලැබීය. එසේම සහකාර ප්‍රවෘත්ති නිලධාරීන් ලෙස පී.එන්. මැද්දේගොඩ, එල්.ආර්. ගුණතිලක, එස්.පී. වෙත්තසිංහ, පී.බී. විජේසිංහ යන මහත්වරුන් කටයුතු කර තිබේ.

දෙපාර්තමේන්තුවේ ආරම්භක ප්‍රධානියා හෙවත් ප්‍රවෘත්‍යාධිකාරී වූයේ පී. නඩේශන් මහතා ය. මෙම ප්‍රවෘත්‍යාධිකාරී තනතුර පසුව ප්‍රවෘත්ති අධ්‍යක්ෂ හා 2009 වර්ෂයේ සිට ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් දක්වා තනතුර උසස් වී තිබේ. එතැන් පටන් ප්‍රවීණ ජනමාධ්‍යවේදීන්, මාධ්‍ය වෘත්තිකයන් හා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් විසින් රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් තනතුර හෙබවූ අතර 2024.10.01 සිට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු වන එච්.එස්.කේ.ජේ. බණ්ඩාර මහතා එම රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ කටයුතු කරමින් සිටි.

රජයේ ආයතන අතර ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සුවිශේෂී වැදගත්කමක් හිමි කර ගන්නේ ඍජුවම මහජනතාවට පුවත් සපයන මාධ්‍ය ආයතන සමග සම්බන්ධ ආයතනය නිසාවෙනි. ඉන් නිකුත් කෙරෙන නිවේදනයක් රජයේ නිල නිවේදනයක් වන්නා සේම එය අතිශයින් නිවැරදි තොරතුරුවලින් සමන්විත විය යුතුය.

එසේ පුවත් සපයන අතර එක්, එක් වකවානුවලදී රජය ගන්නා තීරණ අනුව කටයුතු කිරීමට ද සිදු වී ඇත. 1979, 1980, 1981, 1983,1987,1995,1996 හා 2000 යන වර්ෂවලදී රජය පුවත් වාරණය කළ අතර, එම අවස්ථාවල රටේ කලබලකාරී වාතාවරණයක් පැවතීම ඊට හේතු විය. එවැනි අවස්ථාවලදී පුවත් වාරණය රජයේ නිසි බලධරයා ලෙස ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයාට පැවරුණු රාජකාරියක් විය.

රාජ්‍ය ජනමාධ්‍ය ව්‍යුහයේ පැවති සීමා හඳුනාගෙන ජනතාව වඩාත් සංවර්ධන කාර්යභාරයට දායක කර ගැනීම රජයේ අරමුණ වූයෙන්, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම, සර්වජන ඡන්දබලයේ ජනතා මෙහෙවර යනාදී කරුණු පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේදී රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට පැවරුණු වගකීම වඩාත් සාර්ථකව ඉටු කිරීමට රජයේ චිත්‍රපට අංශය ඉතා පුළුල් මෙහෙවරක් ඉටු කර තිබේ. ජූලියෝ පෙට්‍රෝනි මහතාගෙන් ආරම්භ වූ රජයේ චිත්‍රපට අංශය, නිදහසින් පසු මෙරට සිදු වූ ජාතික සංවර්ධනය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා සුවිශාල මෙහෙවරක් ඉටු කර ඇත. ඒ වාර්තා චිත්‍රපට නිෂ්පාදනය මගිනි. පසුකාලීනව කීර්තිමත් වාර්තා චිත්‍රපට අධ්‍යක්ෂවරුන් රාශියක් බිහි කළ මෙම අංශය, පැරිස් ජාත්‍යන්තර චිත්‍රපට උළෙල ආදී විදේශ සිනමා සම්මාන උළෙල රාශියකදී වාර්තා හා අර්ධ වාර්තා අංශයෙන් ශ්‍රී ලංකාවට සම්මාන දිනා දී ඇත.

ප්‍රජාත්‍රන්තවාදී රටක් තුළ සියලුම පුරවැසියන්ට රාජ්‍ය ප්‍රතිපත්ති හා රජය මගින් සලස්වනු ලබන සේවා,නීති රීති පිළිබඳ තොරතුරු ක්‍රමවත්ව හා විශ්වාසදායක ලෙස නීත්‍යානුකූලව ප්‍රකාශන මගින්

දැනුවත් කිරීමට සැලැස්වීම හා දෙපාර්තමේන්තු ප්‍රකාශන නොවන රජයේ ප්‍රකාශන විකිණීම, ගබඩාකර තබා ගැනීම හා බෙදාහැරීම රජයේ ප්‍රකාශන කාර්යාංශය මඟින් සිදු කරයි. රජයේ ප්‍රකාශන කාර්යාංශය ද ඉතා පුළුල් අරමුණක් යටතේ පවත්වාගෙන යමින් රජයේ නිල ප්‍රකාශන පිළිබඳව නීති, අණපනත් මහජනතාවට මිලදී ගැනීම සඳහා මුද්‍රණය කර බෙදා හැරීමට කටයුතු කර තිබේ. මෙහි ආරම්භක නිලධාරියා ලෙස සේවය කර ඇත්තේ R.V.H. Vantwest මහතාය.

ආරම්භක යුගයේ සිටම රජයේ ප්‍රචාරන වැඩපිළිවෙළ දේශීය වශයෙන් පමණක් නොව ජාත්‍යන්තර වශයෙන් ද ඉටු කළ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ විදේශ තානාපති කාර්යාල ඉලක්ක කර ගෙන අත්පත්‍රිකා, සඟරා හා ප්‍රකාශන නිතිපතා බෙදා හැරීමට ද කටයුතු කර තිබේ. මෙම කාල පරිච්ඡේදයේදී විදේශ තානාපති කාර්යාල ඉලක්ක කර ගෙන පළ කරනු ලැබූ “Week Happening in the Island” සඟරාවද “Introduction Ceylon” ආදී ප්‍රකාශන තුළින් ශ්‍රී ලංකාව පිළිබඳව විශේෂ තොරතුරු විදේශ රටවලට ලබා දීමට කටයුතු කර තිබේ. පසු කාලයේදී ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු විදේශයන්හි ප්‍රචාරය කිරීම සඳහා “Sri Lanka Today” නමින් ත්‍රෛමාසික සඟරාවක් ද පළ කර තිබේ.

රජයේ චිත්‍රපට අංශය ශ්‍රී ලංකාවේ සමාජ සංස්කෘතික සහ ආර්ථික සංසිද්ධීන් ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යයෙන් ප්‍රතිනිර්මාණය කළ පුරෝගාමීම ආයතනයයි. විශේෂයෙන් වාර්තා වැඩසටහන් නිර්මාණකරණය සහ ප්‍රවෘත්ති පට නිර්මාණය මගින් 1948 සිට මේ දක්වා මෙරට සිදුවූ සමාජ දේශපාලන සංස්කෘතිය සංසිද්ධීන් ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යයෙන් ප්‍රතිනිර්මාණය කර අනාගතය වෙනුවෙන් සංරක්ෂණය කරනු ලබන එකම රාජ්‍ය ආයතනයයි. මුල් වකවානුවේ චිත්‍රපට මාධ්‍යයෙන් නිර්මාණකරණය කරන ලද නමුත් මේ වන විට නව තාක්ෂණය සමඟ සම්බන්ධව ඩිජිටල් වීඩියෝ මාධ්‍යයෙන් වාර්තා වැඩසටහන් සහ ප්‍රවෘත්තිපට ඇතුළු ශ්‍රව්‍ය දෘෂ්‍ය වැඩසටහන් නිර්මාණය කරමින් සිටින රාජ්‍ය ආයතනයකි.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සලකුණක් වන සක්වල අතැඹුලක් කළ "දෙසතිය" සඟරාව, එහි මංගල කලාපය එළිදුටු 1978 පෙබරවාරි 04 වැනිදා සිට දශක පහකට ආසන්න කාලයක් මුළුල්ලෙහි තීරණාත්මක සංදිස්ථාන පසුකර අඛණ්ඩව ජන මතය පෝෂණය කරමින් සිටී. ශ්‍රී ලංකේය ජන සන්නිවේදන ක්ෂේත්‍රයේ හැරවුම් ලක්ෂයක් වන මෙකී දෙසතිය සඟරාවෙන් පෝෂණය වූ ලේඛන පරපුර බොහෝය. මෙරට ප්‍රතිපත්ති තීන්දු කරන්නාගේ සිට ගොවියා, කම්කරුවා දක්වා නියෝජනය කරන ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයෙන් හඳුන්වා දුන් එකම පුවත් සඟරාව වන “දෙසතිය”, විශේෂයෙන්ම රජයේ ප්‍රතිපත්ති හා සංවර්ධන වැඩපිළිවෙල ජනතාගත කිරීමේ කාර්යය ද සමඟ දෙසතිය ඉන් ඔබ්බට ගොස් ජන මනසේ බුද්ධිමය විප්ලවයක් ඇති කිරීමට සමත් විය. සමාජීය, ආර්ථික, සංස්කෘතික, කලා, ජාත්‍යන්තර සහ තවත් බොහෝ ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු ඉතාමත් සරල බස් වහරකින් පාඨක රුචිය වඩවන ලෙස දෙසතිය සඟරාවෙන් ඉදිරිපත් කරයි.

1993 දී රාජ්‍ය නොවන රූපවාහිනී නාලිකාවන්ට ප්‍රථම වරට ප්‍රවෘත්ති ප්‍රචාරය කිරීමට රජය අවසරදීම මෙරට මාධ්‍ය ඉතිහාසයේ වැදගත් සිදුවීමක් ලෙස සැලකිය හැකි වේ. මීට සමගාමීව මහජනයාට අවශ්‍ය තොරතුරු පහසුවෙන් ලබා ගැනීම සඳහා 1995 මැයි 18 වැනිදා ජාතික තොරතුරු මධ්‍යස්ථානය බිහි

කිරීම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ තවත් එක් ඉදිරි පියවරක් විය. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන සියලුම මාධ්‍ය ආවරණ කටයුතු සම්බන්ධීකරණය කිරීම හා ඒ සම්බන්ධ සියලු කටයුතු සංවිධානය කිරීම ප්‍රචාරණ ඒකකය මඟින් සිදු කරනු ලබයි. රජයේ නිල ප්‍රවෘත්ති නිවේදන, රජයේ සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ ප්‍රවෘත්ති නිවේදන ඇතුලු ප්‍රවෘත්ති නිවේදන මාධ්‍ය ආයතන වෙත නිකුත් කිරීම, අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම් දීමේ ප්‍රවෘත්ති සාකච්ඡා සංවිධානය කිරීම, අමාත්‍ය මණ්ඩල තීරණ භාෂා ත්‍රිත්වයෙන්ම සකස්කර මාධ්‍ය වෙත නිකුත් කිරීම, මාධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම, ජාතික සහ ජාතික වශයෙන් වැදගත්වන උත්සව අවස්ථාවන්වල මාධ්‍ය සම්බන්ධීකරණ කටයුතු කිරීම, විදේශීය රාජ්‍ය තාන්ත්‍රිකයින්ගේ ශ්‍රී ලංකා නිල සංචාර සම්බන්ධයෙන් මාධ්‍ය සම්බන්ධීකරණ කටයුතු කිරීම, Guide to Media සහ Guide to Ministry දුරකථන නාමාවලීන් පිළියෙල කිරීම, මාධ්‍ය වැඩමුළු හා සාකච්ඡා සංවිධානය කිරීම, කාලීන අවශ්‍යතාවය අනුව මාධ්‍යවේදීන්ට අවශ්‍ය පහසුකම් ලබා දීමට සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම, ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි විශේෂ වාර්තා සකස් කිරීම ද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වේ.

1948 නිදහසත් සමග ඇති කරන ලද දෙපාර්තමේන්තු ආකෘතිය යටතේ යාහැකි උපරිමය දක්වා යන, සිය ගමන් මඟේ එදාට වඩා පසුගිය වර්ෂවල නවීන ලෝකයට ගැළපෙන ආකාරයෙන් සංවිධිත වී ඇති රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව 2024 වන විට අංශ කිහිපයකින් සිය සේවාවන් පවත්වා ගෙන යයි. රජයේ චිත්‍රපට අංශය, ඡායාරූප ඒකකය, රජයේ සමාජ මාධ්‍ය ඒකකය, දෙසතිය හා ප්‍රකාශන ඒකකය, නව මාධ්‍ය ඒකකය (www.news.lk), රජයේ ප්‍රකාශන කාර්යාංශය, මාධ්‍ය හැඳුනුම්පත් ඒකකය, ප්‍රචාරක ඒකකය සහ මාධ්‍ය විමර්ශන හා ජනමාධ්‍ය පර්යේෂණ ඒකකය, විදේශ ප්‍රවෘත්ති ඒකකය, පාසල් මාධ්‍ය සමාජ ප්‍රවර්ධන සංවර්ධන ඒකකය යන අංශ හා ඒකකවලින් සමන්විත රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ක්‍රියාකාරී ආයතනයක් බවට පත් වී ඇත.

මෙම කාර්යභාරය කාලීන වෙනස්කම්වලට ලක් වෙමින් වර්තමානය දක්වාම සාර්ථකව ක්‍රියාත්මක කිරීමට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව යුහුසුළු වනවාක් මෙන්ම පවත්නා යාන්ත්‍රණයන් තුළින් ඒ සඳහා ඉඩ හසර වෙන් කර ගන්නා බවද නිරීක්ෂණයේදී පැහැදිලි වේ.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ආයතන ප්‍රධානීන්

1948 සිට රජයේ ප්‍රවාත්ති දෙපාර්තමේන්තුවේ ආයතන ප්‍රධානීන් ලෙස ප්‍රවෘත්තාධිකාරී, ප්‍රවෘත්ති අධ්‍යක්ෂ සහ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් යන තනතුරු නාම දරමින් පහත නිලධාරීන් කටයුතු කර ඇත.

1948	-	පී. නඩේශන් මහතා
1949	-	ඩී.අයි.එච්.ඒ.ජේ. හුළුගල්ල මහතා
1950	-	වී.ටී.ආර්. විවියන් හොරයින් මහතා
1952	-	ඩී.අයි.එච්.ඒ.ජේ. හුළුගල්ල මහතා
1955	-	නඩේශන් පරරාජශිංගම් මහතා
1956	-	ජී. ලයනල් පෙරේරා මහතා
1957	-	ජී.ඩබ්.ඒ.එම්. පෙරේරා මහතා
1958	-	ජේම්ස් පෙරේරා මහතා
1959	-	ටී.එම්. ජයරත්නම් මහතා
1960	-	තිලක් එරංග ගුණරත්න මහතා
1961	-	ඩබ්.එල්. ප්‍රනාන්දු මහතා
1962	-	එස්.බී. සේනානායක මහතා
1966	-	ඩී. අළුවිහාරේ මහතා
1967	-	පී.එන්. මැද්දේගොඩ මහතා
1968	-	ආචාර්ය එස්.එල්.බී. අමුණුගම
1972	-	පී.එච්. ප්‍රේමවර්ධන මහතා
1974	-	ඩබ්.ආර්.පී. තිලකරත්න මහතා
1977	-	එස්. අනුර ගුණසේකර මහතා
1983	-	මානෙල් අබේරත්න මහත්මිය
1990	-	කේ.එස්. විමලසේන මහතා

1991 - කේ.ආර්.එල්. විජේවර්ධන මහතා

1992 - මහාචාර්ය සුනන්ද මද්දුමබණ්ඩාර

1994 - ආරිය රූබසිංහ මහතා

2003 - කේ.ඒ.බී.ජේ.පී. ජයසේකර මහතා

2004 - ඩබ්.එම්. පියසේන මහතා

2005 - කාන්ති විජේතුංග මහත්මිය

එස්.ඩී. පියදාස මහතා

2006 - වී.පී.කේ. අනුෂ පැල්පිට මහතා

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරුන්

2009.02.01 දින සිට 2010.05.06 දින දක්වා	-	වී.පී.කේ. අනුෂ පැල්පිට මහතා
2010.05.07 දින සිට 2015.01.08 දින දක්වා	-	මහාචාර්ය ආරියරත්න ඇතුගල
2015.01.13 දින සිට 2015.05.07 (වැ.බ.) දින දක්වා	-	කේ.ඩබ්.ටී.එන්. අමරතුංග මහත්මිය
2015.05.08 දින සිට 2016.06.02 දික දක්වා	-	ආචාර්ය දර්ශනී ගුණතිලක
2016.06.06 දින සිට 2017.09.29 දින දක්වා	-	ආචාර්ය රංග කලන්සූරිය
2017.10.13 දින සිට 2018.10.26 දින දක්වා	-	නීතිඥ සුදර්ශන ගුණවර්ධන
2018.10.27 දින සිට 2021.04.07 දින දක්වා	-	කේ.එම්.ජී.එස්. නාලක කලුවැව මහතා
2021.04.08 දින සිට 2021.04.18 (වැ.බ.) දින දක්වා	-	එස්.ආර්.ඩබ්.එම්.ආර්.පී සත්කුමාර මහතා
2021.04.19 දින සිට 2022.09.07 දින දක්වා	-	මොහාන් සමරනායක මහතා
2022.09.08 දින සිට 2024.09.30 දින දක්වා	-	දිනිත් චින්තක කරුණාරත්න මහතා
2024.10.01 දින සිට මේ දක්වා	-	එච්.එස්.කේ.ජේ. බණ්ඩාර මහතා

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

❖ දැක්ම

"නිදහස් හා වගකීමෙන් යුතු මාධ්‍ය සම්ප්‍රදායක් උදෙසා දායක වීම"

❖ මෙහෙවර

"ශ්‍රී ලාංකේය සන්නිවේදන මාධ්‍ය අතර සුහදශීලි පරිසරයක් නිර්මාණය කිරීම හා මාධ්‍ය සංස්කෘතිය නඟා සිටුවීම සඳහා අවශ්‍ය මෙහෙයවීම සිදුකරමින් නිවැරදි තොරතුරු හා රජයේ දැක්ම දැන ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම''

❖ අරමුණු

- ජාතික වශයෙන් වැදගත්වන්නා වූ හා රජයේ ප්‍රතිපත්ති, සැලසුම් හා සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීම.
- උසස් මාධ්‍ය සංස්කෘතියක් බිහිකිරීම.
- වැදගත් හා කාලීන සිදුවීම්, රජයේ තොරතුරු හා සිදුවීම් ශ්‍රව්‍ය, දෘෂ්‍ය හා මුද්‍රිත මාධ්‍යයන් යොදා ගනිමින් වාර්තාගත කිරීම හා ඒවා සංරක්ෂණය කිරීම.
- මාධ්‍ය ක්ෂේත්‍රයට අවශ්‍ය වන්නා වූ මානව හා භෞතික සම්පත් සංවර්ධනය කිරීම.
- මාධ්‍ය ක්ෂේත්‍රය හා මාධ්‍යවේදීන්ට අවශ්‍ය පහසුකම් සැපයීම, පුහුණුව ලබා දීම හා අවශ්‍ය අවස්ථාවන්හි දී සුබසාධන කටයුතු සඳහා නායකත්වය දැරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

ඉහළ සංවර්ධන මට්ටමක් සහ තිරසාර ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය ආයතන සහභාගී කර ගනිමින් සන්නිවේදනයෙන් දායක වීම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වන්නේය.

- අමාත්‍යාංශයන්හි අදාළ තොරතුරු ජනමාධ්‍ය වෙත නිකුත් කිරීම.
- රජයේ සංවර්ධන ක්‍රියාදාමය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.
- ජාතික වශයෙන් වැදගත් අවස්ථාවන් සහ හදිසි තත්ත්වයන් පිළිබඳව දැනුවත් කිරීම.
- රජයේ සංවර්ධන ප්‍රගතිය පිළිබඳ චිත්‍රපට හා වීඩියෝ දර්ශන මාර්ගයෙන් මහජනතාව දැනුවත් කිරීම.
- රජයේ සංවර්ධන තොරතුරු ඓතිහාසික තොරතුරු හා අනෙකුත් කාලයේ වැදගත්කමක් ඇති තොරතුරු පිළිබඳ ප්‍රවෘත්ති හා වාර්තා වීඩියෝ චිත්‍රපට නිෂ්පාදනය කිරීම.
- පර්යේෂණාත්මක වාර්තා චිත්‍රපට නිෂ්පාදනය.
- විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා දේශීය තොරතුරු විදේශවලටත්, විදේශ තොරතුරු මෙරට ජනතාවටත් ලබා දීම.
- රජයේ සමාජ මාධ්‍ය ජාල හා News.lk වෙබ් අඩවිය භාෂාත්‍රයෙන්ම පවත්වාගෙන යාම.
- දෙසතිය සඟරාව, යාවත්කාලීනව පවත්වාගෙන යාම.
- රජයේ ප්‍රකාශන කාර්යාංශය ක්‍රියාකාරීව පවත්වාගෙන යාම.
- දේශීය හා විදේශීය මාධ්‍යවේදීන් ජාතික මෙහෙවර සහ රාජතාන්ත්‍රික උත්සව සඳහා සම්බන්ධීකරණය
- ප්‍රාදේශීය සංවර්ධන ප්‍රයත්න සහ අමාත්‍යාංශයන්හි නව වැඩපිළිවෙළ ජනතාව අතරට ගෙනයාම සඳහා මාධ්‍ය චාරිකා සංවිධානය කිරීම
- ජාතික වශයෙන් වැදගත් උත්සවවල ප්‍රධාන මාධ්‍ය සම්බන්ධීකාරක වශයෙන් ක්‍රියා කිරීම.
- වෘත්තිය ප්‍රාදේශීය හා විදේශ මාධ්‍යවේදීන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම.
- රේඛීය අමාත්‍යාංශයන්හි මාධ්‍ය ඒකක සමඟ සමීප සම්බන්ධීකරණය පවත්වාගෙන යාම.
- කාලීන හා ජාතික වශයෙන් වැදගත් වන සිදුවීම් වලට අදාළ පොත් මුද්‍රණය කිරීම.
- ජනාධිපතිවරයාගේ දේශීය හා විදේශීය නිල උත්සවයන්හි මාධ්‍ය ආවරණය මුද්‍රිත, ශ්‍රව්‍ය දෘශ්‍ය වාර්තා වශයෙන් රැස් කිරීම.
- දෛනික භාෂාත්‍රයෙන්ම පළවන පුවත්පත් විමර්ශනය කොට වාර්තා සකස් කර ජනාධිපතිවරයා හා අදාළ අනෙකුත් පාර්ශව වෙත ඉදිරිපත් කිරීම.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
සංවිධාන සැලැස්ම 2025



අනුමැතිය :

....

එච්.එස්.කේ.ජේ. බණ්ඩාර
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

1.5 දෙපාර්තමේන්තුවේ අංශ / ඒකක

1. පාලන අංශය
2. ගිණුම් අංශය
3. අභ්‍යන්තර විගණක ඒකකය
4. නිෂ්පාදක ඒකකය
5. සංස්කරණ ඒකකය
6. ශබ්ද හා ශ්‍රවණාගාර ඒකකය
7. වීඩියෝ කැමරා හා ආලෝකකරණ ඒකකය
8. චිත්‍රපට හා ඩිජිටල් සංරක්ෂණ ඒකකය
9. ඡායාරූප ඒකකය
10. ප්‍රචාරක ඒකකය
11. සමාජ මාධ්‍ය ඒකකය
12. නව මාධ්‍ය ඒකකය
13. දිස්ත්‍රික් මාධ්‍ය ඒකක සම්බන්ධීකරණ ඒකකය
14. දෙසතිය හා ප්‍රකාශන ඒකකය
15. මාධ්‍ය හැඳුනුම්පත් ඒකකය
16. ඩිජිටල් හා තොරතුරු තාක්ෂණ ඒකකය
17. රජයේ ප්‍රකාශන කාර්යාංශය
18. ජනමාධ්‍ය පර්යේෂණ ඒකකය
19. මාධ්‍ය විමර්ශන ඒකකය
20. විදේශ ප්‍රවෘත්ති ඒකකය
21. පාසල් මාධ්‍ය සංවර්ධන ඒකකය
22. පුස්තකාලය
23. ප්‍රවාහන ඒකකය
24. භාෂා පරිවර්තක ඒකකය
25. නඩත්තු ඒකකය
26. ගබඩාව

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන

- දිස්ත්‍රික් මාධ්‍ය ඒකක

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව යටතේ දිස්ත්‍රික්ක 25 ක් පුරා දිස්ත්‍රික් මාධ්‍ය ඒකක ස්ථාපිත කර ඇත.

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

- රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ විදේශ ආධාර ලබන ව්‍යාපෘති නැත.

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

❖ ප්‍රගතිය හා ඉදිරි දැක්ම

නවීන තාක්ෂණයත් සමඟ වර්තමානයේ දෛනික කටයුතු සම්ප්‍රදායික ක්‍රමවල සිට ඩිජිටල්කරණයට (Digitalization) ලක් කර එම කාර්යයන් වඩාත් පහසුවෙන් ඉටු කිරීම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ඉදිරියට පියවර තබමින් සිටියි.

සියලු මාධ්‍ය ආයතන සමග සම්බන්ධීකරණයෙන් ප්‍රවෘත්ති / තොරතුරු සම්පාදන මූලාශ්‍රය ලෙස රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව කටයුතු කරන අතර, රජයේ සියලු කාලීන හා සංවර්ධන තොරතුරු රජයේ සහ පෞද්ගලික මුද්‍රිත විද්‍යුත් මාධ්‍ය වෙත ලබාදීමේ රජයේ යාන්ත්‍රණය ලෙස ක්‍රියා කරයි.

එසේම වර්තමානයේ ඩිජිටල් අවකාශය තුළ ජනතාවට විශ්වසනීය තොරතුරු සන්නිවේදනය කිරීමේ ඩිජිටල් වේදිකාව මෙම වසරේ ඉහළ මට්ටමට ගෙන ඒමට හැකි වීම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ලැබූ සුවිශේෂී ජයග්‍රණයකි.

දෙපාර්තමේන්තුව යටතේ පවතින වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය ජාල කඩිනමින් තොරතුරු සන්නිවේදනය කරන ජාලයන් වීම විශේෂත්වයකි.

❖ ඩිජිටල්කරණයේ සුවිශේෂී අවස්ථා

සමාජ මාධ්‍ය ජාලය තුළ බොහෝ අවස්ථාවල සාවද්‍ය තොරතුරු සංසරණය වන බැවින් හැම විටම ජනතාවට ලැබෙන තොරතුරුවල නිරවද්‍යභාවය, විශ්වසනීයත්වය සහතික කිරීම අත්‍යවශ්‍ය වේ. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව www.dgi.gov.lk, "Department of Government Information" YouTube නාලිකාව, FaceBook පිටුව, www.news.lk වෙබ් අඩවිය, YouTube නාලිකාව, FaceBook පිටුව හා X Crop (Twitter) යන සියලු ජාල ඔස්සේ විශ්වසනීය තොරතුරු ජනතාව වෙත ඍජුව සන්නිවේදනය කරයි.

තවද දෙපාර්තමේන්තුවේ PABX පද්ධතිය හා පුස්තකාල කළමණාකරණ පද්ධතිය සකස් කරන ලදී.

මාධ්‍ය වෙත පහසුකම් සැලසීම		
	වැඩසටහන	ක්‍රියාත්මක කිරීම
01	මාධ්‍ය වෙත තොරතුරු සන්නිවේදනය සඳහා cloud අවකාශය භාවිතය	රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, මාධ්‍ය වෙත තොරතුරු සම්පාදන මූලාශ්‍රය ලෙස සාම්ප්‍රදායික ක්‍රමයෙන් ඔබ්බට ගොස් වීඩියෝපට, හඬ පට, ඡායාරූප, ප්‍රවෘත්ති නිවේදන සියල්ල සියලු මාධ්‍ය වෙත එකම මොහොතක් තුළ කඩිනමින් ලබා දෙයි.
02	දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබන සියලුම මාධ්‍ය ආවරණ මාධ්‍ය වෙත කඩිනමින් නිකුත් කිරීම	රජය ක්‍රියාත්මක කරන වැඩසටහන් සම්බන්ධ සියලු තොරතුරු ඇතුළත් නිවේදන සහිතව වීඩියෝපට, හඬ පට, ඡායාරූප යනාදිය මාධ්‍ය වෙත නිකුත් කරයි. පෙර ඒ සඳහා විධිමත් ක්‍රමවේදයක් නොතිබුණු අතර, දැන් මනා සම්බන්ධීකරණයෙන් සියලුම මාධ්‍ය ආයතන සහභාගී කර ගැනීමට හැකි වී තිබේ.
03	Bulk E mail System සකස් කිරීම	මුද්‍රිත, විද්‍යුත්, වෙබ් මාධ්‍ය, නව මාධ්‍ය, විදෙස් මාධ්‍ය ඇතුළු සියලුම මාධ්‍යයන් වෙනුවෙන් 200කට ආසන්න ඊමේල් පද්ධතියක් තුළින් තොරතුරු හුවමාරු කර ගනු ලැබේ.
04	මාධ්‍ය වෘත්තිකයන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත නිකුත් කිරීම	ලිපිගොනු පාදක කොටගෙන මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම වෙනුවට වාර්තා ගත දත්ත පද්ධතියක් (Data Base) භාවිතයෙන් එය ඉටු කිරීමට කටයුතු කරනු ලැබේ.

ජනතාව වෙත සෘජුව තොරතුරු ලබාදීම		
01	"Department of Government Information" YouTube විකාශය පවත්වාගෙන යාම	Department of Government Information You Tube නාලිකාව 2024 හා සසඳන විට 2025 වර්ෂයේ ප්‍රේක්ෂක සංඛ්‍යාව ඉහළ වශයෙන් වර්ධනය පෙන්නුම් කරයි. එහිදී වීඩියෝ පට විවිධ තේමා ඔස්සේ සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කර තිබේ. එනම්, INFO News, INFO Highlights, ඇතුළාන්තය (Inside), INFO News Parliament Highlights, Provincial Highlights, Taller, Documentary, Short Video Reel, සජීව විකාශ ආදී වශයෙනි. Subscribers 22%, watch time 52%, Views 43% යනාදී වශයෙන් වර්ධනයක් ප්‍රගතියක් ළඟා කර ගැනීමට හැකි විය. 2025 වර්ෂයේ පමණක් වීඩියෝ පට 1682 ක් යාවත්කාලීන කර තිබෙන අතර වීඩියෝ නැරඹුම් වාර ද ඉහළ මට්ටමක පවත්වා ගැනීමට හැකි වී තිබේ.
02	"Department of Government Information" FaceBook පිටුව පවත්වාගෙන යාම	මේ වන විට දෙපාර්තමේන්තුවේ Facebook පිටුව සමඟ 334K සීමාව පසුකරමින් පරිශීලකයින් පිරිසක් (Followers) එක්විය. එමඟින් Facebook නැරඹුම් වාර මිලියන 20ක (28 days - 20M පවත්වා ගැනීම) දක්වා ඉහළට ගෙන ඒමට හැකි වූ අතර මෙම පිටුවේ ඉහළම වාර්තාවක් 2025 වර්ෂයේ තැබීමට හැකි විය. 2025 වර්ෂයේ සම්පූර්ණ නැරඹුම් වාර මිලියන 81.3ක් දක්වා වර්ධනය කර ගැනීම මෙම පිටුව ලැබූ ඉහළ ප්‍රගතියකි. එහිදී අන්තර්ගතය විධිමත් හා නිර්මාණාත්මක ක්‍රම ඔස්සේ සකස් කිරීමට අවධානය යොමු වූ පසු Facebook like, people reached, engage සංඛ්‍යාව දිනෙන් දින ඉහළ මට්ටමකට ගෙන ඒමට හැකි විය. කාලීන හා සංවර්ධන ප්‍රවෘත්ති ඇතුළත් වීඩියෝ පට, සජීව විකාශ (Live) (You Tube නාලිකාවේ සියලුම වීඩියෝ) නිර්මාණාත්මක post සහ ඡායාරූප කෙටි විස්තරයක් සහිතව මෙහි යාවත්කාලීන කිරීම සිදු වේ. මෙම වර්ෂයේ නව පරිශීලකයින් (Net Followers) 411% කින් ඉහළ මට්ටමට පැමිණීමත් ප්‍රතිචාර දැක්වීම් (Engagement) 216% දක්වා ඉහළට ගෙන ඒමට හැකිවීම විශේෂ ප්‍රගතියක් ලෙස පෙන්වා දිය හැක.

03	www.news.lk web අඩවිය	කාලීන හා සංවර්ධන සියලුම ප්‍රවෘත්ති මෙම වෙබ් අඩවිය ඔස්සේ යාවත්කාලීන කිරීම, භාෂා ත්‍රිත්වයෙන්ම සිදු වන අතර පැය 24 පුරා යාවත්කාලීන වන රජයේ නිල පුවත් වෙබ් අඩවිය මෙයයි. මෙම වෙබ් අඩවිය යටතේ Facebook පිටුව, Youtube නාලිකාව, X Crop. (Twitter) පිටු ක්‍රියාත්මක වේ. එසේම කැබිනට් මාධ්‍ය සාකච්ඡාව ඇතුළු විශේෂ මාධ්‍ය සාකච්ඡා සජීවී විකාශය පවත්වාගෙන යාම ආරම්භ කර ඇති අතර ඒ සඳහා ඉහළ ප්‍රතිචාර ලැබෙමින් පවතී.
04	දෙසතිය සඟරාව	ජනතාව වෙත කාලීන හා සංවර්ධන මෙන්ම විදෙස් තොරතුරු කැටි කරගත් වසර 44ක ඉතිහාසයකට හිමිකම් කියන දෙසතිය සඟරාව නියමිත පිරිදි, 2025 වර්ෂය තුළ ඉතා ඉහළ නිමාවකින් හා ප්‍රමිතියකින් යුතුව දෙසතිය සඟරා දොළහක් (12) මුද්‍රණය කර ඇත.
මාධ්‍ය සංරක්ෂිත පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.		
05	ඩිජිටල් සංරක්ෂිත පද්ධතියක් ස්ථාපිත කිරීම	දෙපාර්තමේන්තුව සතුව පවතින ඓතිහාසික වැදගත් චිත්‍රපට, වීඩියෝ පට, ඡායාරූප යනාදිය ඩිජිටල් තාක්ෂණයට හැරවීමේ (Convert to Digital) ව්‍යාපෘතියක් ද ආරම්භ කර තිබේ. මේ වන විට පැරණි චිත්‍රපට 467ක් පමණ ඩිජිටල් තාක්ෂණයට convert කර, සංරක්ෂණය කිරීමට කටයුතු යොදා ඇත. ඊට අමතරව ඩිජිටල් සංරක්ෂිත පද්ධතිය ස්ථාපනය කිරීම පසුගිය වසරේ සිදු වූ ප්‍රධාන කාර්යයක් වූ අතර එහි විශේෂිත වූ වීඩියෝ පට, ඡායාරූප සංරක්ෂණය කිරීම එදිනෙදා සිදු කෙරෙන කාර්යයක් බවට මෙම වසර තුළ ද පත් කිරීමට හැකිවීම.

- **මාධ්‍ය වෙත තොරතුරු ලබාදීමේ පහසුකම් විධිමත් ලෙස පුළුල් කිරීම**

යහපත් සමාජ පැවැත්මක් උදෙසා විශ්වසනීයත්වයෙන් සත්‍ය තොරතුරු වාර්තාකරණය උදෙසා මාධ්‍ය ආයතන තොරතුරුවලින් සන්නන්ධ කිරීම කාලීන අවශ්‍යතාවකි. රජයේ සංවර්ධන හා කාලීන තොරතුරු විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ මාධ්‍ය වෙත සන්නිවේදනය කිරීම පිණිස රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව Cloud තාක්ෂණය භාවිත කරමින් මාධ්‍ය ආයතන වෙත වීඩියෝ පට, ඡායාරූප, මාධ්‍ය නිවේදන යන සියල්ල කඩිනමින් ලබාදීමේ විධිමත් ක්‍රමවේදය ආරම්භ කර තිබේ.

- **විශේෂ ජයග්‍රහණ**

1. 92% ක ප්‍රාග්ධන ප්‍රගතිය අත්පත් කර ගැනීම.
2. දෙපාර්තමේන්තුවේ Departnment of Government Information හා news.lk යන නිල Facebook පිටු නැරඹුම් වාර මිලියනය ඉක්මවන ලදී.
3. චිත්‍රපට සංරක්ෂණාගාර ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම.
4. රසායනාගාර ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම.
5. පැරණි ශ්‍රවනාගාරය අලුත්වැඩියා කිරීම.
6. දෙපාර්තමේන්තුවේ නේවාසිකාගාරය නවීකරණය කිරීම.
7. දෙපාර්තමේන්තුවේ වාහන සඳහා නව රථගාලක් ඉදිකිරීම.
8. ප්‍රකාශන කාර්යාංශ ගොඩනැගිල්ලේ වහලය හා අගුව අලුත්වැඩියා කිරීම.
9. මාධ්‍ය විමර්ශන ඒකකය නවීකරණය කිරීම.
10. ශබ්ද ඒකකය නවීකරණය කිරීම.
11. ඡායාරූප ඒකකය අලුත්වැඩියා කිරීම.
12. දෙපාර්තමේන්තු පරිශ්‍රයේ භූමි අලංකරණය සිදු කිරීම.
13. රජයේ චිත්‍රපට අංශය සඳහා වීඩියෝ කැමරා 04ක් ද, ඡායාරූප ඒකකය සඳහා කැමරා 02 හා කාමර කාච 02 මිලදී ගැනීම.

❖ අනාගත ඉලක්ක

(i) රටේ සියලු පුරවැසියන්ට කාර්යක්ෂමව නිවැරදි තොරතුරු ලබා ගැනීමේ ප්‍රවේශයන් පුළුල් කිරිම.

(ii) රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් පිළිබඳ තොරතුරු ජනතාව අතරට ගෙන යාම.

(iii) දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුමෙන් හා අත්දැකීමෙන් සන්නද්ධ කිරීම.

(iv) මාධ්‍ය සාක්ෂරතාවය ඇති කිරීම.

(v) පාසල් මට්ටමින් මාධ්‍ය අධ්‍යාපනය පුළුල් කිරීමට කටයුතු කිරීම.

(vi) මාධ්‍ය විශ්ලේෂණ වාර්තා භාවිත කරන රාජ්‍ය නිලධාරීන්ගේ තෘප්තිමත්භාවය වැඩිදියුණු කිරීම.

(vii) සංරක්ෂිත මාධ්‍ය පයිත පරිශීලකයන්ගේ තෘප්තිය වැඩි දියුණු කිරීම.

(viii) ප්‍රකාශන කාර්යාංශය නවීකරණය කිරීම.

(ix) ආපනශාලා ගොඩනැගිල්ල නවීකරණය සිදු කිරීම..

(x) රියදුරු කාමරය නවීකරණය කිරීම.

(xi) දෙපාර්තමේන්තු මුර කුටිය ඉදිකිරිම.

(xii) ප්‍රකාශන කාර්යාංශ ගොඩනැගිල්ල සහ චිත්‍රපට රසායනාගාර ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම.

එච්.එස්.කේ.ජේ. බණ්ඩාර
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්/ගණන්දීමේ නිලධාරි

03 පරිච්ඡේදය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ - එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2025		සටහන	2025 රු.	තතය නැවත ගලපන ලද 2024 රු.	
-	**ආදායම් ලැබීම්**				
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	ඒසීඒ-1
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**				
-	භාණ්ඩාගාර අග්‍රිම		494,759,000	340,319,000	ඒසීඒ-3
-	තැන්පතු		12,623,754	5,148,436	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		13,322,463	12,704,762	ඒසීඒ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**520,705,217**	**358,172,198**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ) + (ආ)**		**520,705,217**	**358,172,198**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		66,518	280	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ) – (ඈ)		**520,638,699**	**358,171,918**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	

227,300,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	221,401,102	189,321,489	
144,000,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	110,962,931	115,880,417	ඒසීඒ-2(ii)
1,700,000	සහනාධාර, ප්‍රදාන සහ මාරු කිරීම්	7	655,013	832,395	
-	පොළී ගෙවීම්	8	-	-	
	වෙනත් පුනරාවර්තන වියදම්	9		56,265	
373,000,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**333,019,046**	**306,090,566**	
	මූලධන වියදම්				
88,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	10	80,433,081	18,883,440	
76,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	72,149,590	33,051,222	
-	ප්‍රාග්ධන මාරු කිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
1,500,000	හැකියා වර්ධනය	14	1,487,100	596,500	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
166,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**154,069,771**	**52,531,162**	
-	තැන්පතු ගෙවීම්		7,680,720	5,093,111	ඒසීඒ-4
-	අත්තිකාරම් ගෙවීම්		16,037,421	13,419,042	ඒසීඒ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
-	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		23,718,141	18,512,152	
-	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		510,806,958	377,133,880	
-	2024 දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ=(ඉ-එ)		9,831,741	(18,961,962)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		9,831,741	(18,961,962)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසීඒ-3
			9,831,741	(18,961,962)	

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2025 (රු.)	2024 (රු.)
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	2,010,640,916	1,942,025,318
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	40,269,491	37,554,534
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**2,050,910,407**	**1,979,579,851**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		35,003,020	37,231,097
දේපළ පිරියත හා උපකරණ සංචිතය		2,010,640,916	1,942,025,318
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම	ඒසීඒ-4	5,266,471	323,437
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**2,050,910,407**	**1,979,579,851**

පිටු අංක 07 සිට 38 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 39 සිට 75 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද, මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව සිදු කර ඇත.** ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත්, ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තා කරන ආයතනය තුළ පවතින බවත්, මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත්, ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදු කිරීමට වරින් වර සමාලෝචන සිදු කරන බවත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන ගණකාධිකාරි
නම : අනිල් ජාසිංහ	නම : එච්.එස්.කේ.ජේ.බණ්ඩාර	නම : ඩබ්ලිව්. ඒ. ටී. අයි. වික්‍රමසිංහ
තනතුර : ලේකම්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යංශය	තනතුර : ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්	දිනය : 2026.02 19
දිනය : 2026.02. 24	දිනය : 2026.02	
විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ ලේකම් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය "සුවසිරිපාය" 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.	එච්.එස්.කේ.ජේ. බණ්ඩාර රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව කොළඹ 05.	ඩබ්. ඒ. ටී. අයි. වික්‍රමසිංහ ප්‍රධාන ගණකාධිකාරි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව කොළඹ - 05

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තතාය	
	2025	2024
	රු.	රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	18,505,678	14,833,035
අග්‍රිම ලැබීම්	494,759,000	340,319,000
අත්තිකාරම් අයකර ගැනීම්	10,431,411	10,809,221
තැන්පතු ලැබීම්	12,623,754	5,148,436
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**536,319,843**	**371,109,692**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	326,773,320	298,767,896
සහනාධාර සහ මාරුකිරීම්	655,012	832,395
මුලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම,වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	152,806,954	50,835,786
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	33,517,082	3,429,153
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	66,518	280
අත්තිකාරම් ගෙවීම්	15,872,060	13,217,891
තැන්පතු ගෙවීම්	7,680,720	5,093,111
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**503,854,584**	**372,176,512**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) = (අ) - (ආ)	**(1,051,823)**	**(1,066,820)**

	සත්‍ය	
	2025	**2024**
	රු.	රු.
<u>**ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u>		
පොලී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**-**	**-**
<u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u>		
මූලධන වියදම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**-**	**-**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ) = (ඇ) - (ඉ)	**-**	**-**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ) = (ඇ) + (ඊ)	**(0)**	**(0)**
<u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
<u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ) = (ඌ) - (එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) + (ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

(1) පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙළ කර ඇත.

(2) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2025 ජනවාරි **01** සිට දෙසැම්බර් **31** දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

(3) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

(4) ආදායම් හඳුනා ගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

(5) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම්, එම වත්කම්, දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනා ගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

(6) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

(7) මුදල් හා මුදල් සමාන දෑ

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම ඇස්තමේන්තුවේ % ලෙස
20.06.02.01	වාහන	-	-	-	-
20.06.02.02	අනෙකුත්	-	-	0.067	-
20.02.01.01	රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී	-	-	-	-
20.02.01.99	රජයේ වත්කම්වලින් ලැබෙන ආදායම - කුලී - අනෙකුත් කුලී	-	-	-	-
20.02.02.99	පොළිය - අනෙකුත්	1,000	1,000	1.631	163.10
20.03.01.00	විකුණුම් හා ගාස්තු - දෙපාර්තමේන්තුමය විකිණීම්	1,200	2,000	3.585	179.24
20.03.02.99	විකුණුම් හා ගාස්තු - පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් විවිධ	0.020	-	0.256	-
20.03.03.02	විකුණුම් හා ගාස්තු - දඩ මුදල් හා රාජසන්තක කිරීම් - අනෙකුත්	-	-	-	-
20.03.99.00	විකුණුම් හා ගාස්තු - අනෙකුත් ලැබීම්	0.500	0.500	0.841	168.20
20.05.99.00	වර්තන පැවරීම්, ජාතික ලොතරැයි මණ්ඩලය හා අනෙකුත් පැවරුම්	-	-	-	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	රු.363,000,000.00	රු.373,000,000.00	රු.333,019,045.00	89.28
ප්‍රාග්ධන	රු.165,000,000.00	රු.166,000,000.00	රු.154,069,771.45	92.81

3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		සත්‍ය වියදම	ප්‍රතිපාදනව ල % ලෙස
			මුදල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
01.	සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය	වරිපනම් බද්ධ ගෙවීමට	-	931,836.00	931,836.00	100%
		ඔවුන්ගේ බඳු අංශය දෙපාර්තමේන්තු ගොඩනැලිල්ලේ පවත්වාගෙන යාම සඳහා විදුලි බිලෙන් 3%ක් ගෙවීමට	-	180,000.00	167,081.70	93%
02.	රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව	ඔවුන්ගේ මුද්‍රණ අංශය දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ පවත්වාගෙන යාම සඳහා විදුලි බිලෙන් 25%ක් ගෙවීමට	-	1,400,000.00	1,367,347.45	98%
03	බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	සිරි දළඳා වන්දනාව වෙනුවෙන් පැවැත්වෙන මාධ්‍ය වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා ගෙවීම	-	1,605,000.00	406,495,74	25%
04.	මැතිවරණ කොමිසන් සභාව	ජනාධිපතිවරණ රාජකාරි සඳහා ගෙවීම් කිරීම	-	529,831.00	529,831.00	100%
05.	ජනාධිපති කාර්යාලය	"රටම එකට - ජාතික මෙහෙයුම" වැඩසටහනේ මාසයක කාලයක් තුළ සිදු කරන ප්‍රචාරණ වැඩසටහන් ස්ථාපිත කිරීම සඳහා ගෙවීම	-	30,000,000.00	30,000,000.00	100%
එකතුව			**-**	**34,646,667.00**	**33,402,591.89**	**96.41%**

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2025 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2025 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	**306,174,426.66**	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	**470,533,764.69**	-	-
9153	ඉඩම්	-	**1,227,750,000.00**	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	**4,817,440.80**	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	**3,211,528.00**	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No.	සීඒඑම්/ඒ/ඩීඅයි/එෆ්ඒ/2025/59	ඔබේ අංකය உமது இல. Your No.		දිනය திகதி Date	2026 මැයි 29 දින

Department of Government Information
05 JUN 2026
Director General's Office

ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්,

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

ශීර්ෂය - 210 , රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යථෝක්ත වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනයේ මුල් පිටපත (සිංහල , ඉංග්‍රීසි , දෙමළ) මේ සමග එවා ඇත.

එච්.ඒ.යූ.ඩී.සරත් කුමාර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත : අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No.	සිඑම්/ඒ/ඩීඅයි/එෆ්ඒ/2025/59	
ඔබේ අංකය உமது இல. Your No.		
දිනය திகதி Date	2026 මැයි 29 දින	

ගණන්දීමේ නිලධාරී.
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

ශීර්ෂය 210 - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වා ගණනය කළ මතය

ශීර්ෂය 210 - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේ දී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින් මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වා ගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වා ගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3. කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූලධන වියදම්

(i) 2025 දෙසැම්බර් 17 දිනැති අංක 02/2025 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ අංක 7.8 හා 7.9 වැනි මාර්ගෝපදේශ ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේ දී ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් වැය කිරීම් යටතේ වන '' මූලධන වත්කම් ඉදිකිරීම් හෝ මිල දී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් '' යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත් වත්කම් අත්පත් කර ගැනීමට දරන ලද වියදම වන රු.71,236,392, මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුදල් වැය කිරීම් යටතේ මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරු කිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම් සඳහා දරන ලද රු. 81,570,562 වෙන් වෙන්ව දැක්විය යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් සම්පූර්ණ මූලධන වියදම වන රු. 152,806,954ක වටිනාකම මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරු කිරීම් ලෙස මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුදල් වැය කිරීම් යටතේ දක්වා තිබුණි.

(ii) 2024 වර්ෂය සඳහා දක්වන ලද සංසන්දනාත්මක සංඛ්‍යා ද 7.8 හා 7.9 මාර්ගෝපදේශවල සඳහන් පරිදි සංශෝධනය විය යුතු බව මාර්ගෝපදේශ අංක 7.10 යටතේ දක්වා තිබුණු අතර ඊට අනුකූලව ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් වැය කිරීම් යටතේ මූලධන වත්කම් ඉදිකිරීම් හෝ මිල දී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් රු. 31,627,977ක් ලෙසත්, මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුදල් වැය කිරීම් යටතේ මූල ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරු කිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම් සඳහා දරන ලද රු. 19,207,810ක් ලෙසත් වෙන් වෙන්ව දැක්විය යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් සම්පූර්ණ මූලධන වියදම වන රු.50,835,787ක වටිනාකම මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරු කිරීම් ලෙස සඳහන් කර තිබුණි.

1.6.2 අත්තිකාරම් ගෙවීම

2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ 02/2025 හි 3.1 මාර්ගෝපදේශය යටතේ CIGAS ඩෙස්ක්ටොප් යෙදුම මගින් උත්පාදනය කරන ලද ශේෂ පිරික්සුම කිසිදු වෙනස් කිරීමකින් තොරව භාවිතා කර මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතු බවත්, මාර්ගෝපදේශ අංක 7.7 යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේ දී මුදල් සහ හරස් සටහන් යන දෙකම සැලකිල්ලට ගත යුතු බවත් සඳහන් විය. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ සඳහන් කළ යුතු අත්තිකාරම් අය කර ගැනීම් වටිනාකම රු.11,483,234ක් වුවත් දෙපාර්තමේන්තුව විසින් හරස් සටහන් සැලකිල්ලට ගැනීමකින් තොරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ අත්තිකාරම් අය කර ගැනීම් වටිනාකම රු.10,431,411ක් ලෙස දක්වා තිබුණි.

1.6.3 මූල්‍ය නොවන වත්කම්

(i) 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය අනුව දේපළ පිරියත හා උපකරණවල වටිනාකම රු. 2,010,640,916ක් ලෙස සටහන් කර තිබුණ ද භාණ්ඩාගාර මුද්‍රිතය (SA - 82) අනුව එදිනට එම ශේෂය රු. 2,012,487,160ක් වූයෙන් එම ශේෂ අතර රු. 1,846,244ක වෙනසක් පවතින බව ද, එම වටිනාකමින්ම දේපළ පිරියත හා උපකරණ සංචිතයේ ද වෙනසක් පවතින බව ද නිරීක්ෂණය විය.

(ii) 1999 වර්ෂයේ දී ප්‍රංශ ණය ආධාර යටතේ මිලදී ගෙන තාක්ෂණික ක්‍රමවේදයන් යල්පැනීම හේතුවෙන් භාවිතයට නොගෙන නිශ්කාර්යව පවතින අනාගත ආර්ථික ප්‍රතිලාභයක් නොමැති Debri වර්ණ රසායනාගාර යන්ත්‍රය රු.12,000,000ක වටිනාකමට මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති අතර සුන්බුන් අගය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.5.1 (iv)	Debri වර්ණ රසායනාගාර යන්ත්‍රයේ සුන්බුන් අගය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.	1.6.3 (ii)

3. මූල්‍ය සමාලෝචනය

1.1 වියදම් කළමනා කරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i) සමාලෝචිත වර්ෂයේ දී දෙපාර්තමේන්තුව සඳහා අංක 210-1-01-1001 හා අංක 210-1-02-1001 දරන වැය විෂයයන් වෙනුවෙන් රු.11,000,000 ක පරිපූරක ඇස්තමේන්තු අනුමත කර තිබූ අතර මූල්‍ය ප්‍රකාශ සමග ඉදිරිපත් කළ ඒ සිජ් -2, ඒ සිජ් - 2 (i) හා ඒ සිජ් - 2(ii) ආකෘතිවල ඉහත පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයට අමතරව රු. 344,000,000ක් පරිපූරක ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන ලෙස දක්වා තිබුණි.

ii) දෙපාර්තමේන්තුව සඳහා රු.539,000,000ක ශුද්ධ මුදල් ප්‍රතිපාදනයක් පැවති අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු. 487,088,817ක් උපයෝජනය කර තිබුණි. පුනරාවර්තන වැය විෂයන් හයක සහ එක් මූලධන වැය විෂයක සියයට 40 ට වැඩි ඉතුරුම් පැවතුණි.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i) 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 255/2017 හි විධිවිධානවලට පටහැනිව අංක 210-01-01-1002 හා 210 -01-02-1002 දරන වැය විෂයන් දෙකට අදාළ ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා රු.351,437ක බැරකම්වලට එළඹී තිබුණි.

ii) 210-01-01-1002 වැය විෂය යටතේ භාණ්ඩාගාර මුද්‍රිත SA - 92 අනුව දෙසැම්බර් 31 දිනට බැරකම් වටිනාකම රු. 475,402ක් වුව ද දෙපාර්තමේන්තු බැරකම් ලේඛනය අනුව එම වටිනාකම රු. 642,798ක් වූයෙන් රු.167,396ක වෙනසක් පැවතුණි.

3.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණදීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 4.1.3 ඡේදවල සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

	නීති රීති රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(i)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ. 104	දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු අතින් DELL වර්ගයේ ලැප්ටොප් යන්ත්‍රයක් 2019 ඔක්තෝබර් මාසයේ දී නැති වී තිබූ අතර ඒ පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ii)	2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 05 වැනි ඡේදය හා 2025 මාර්තු 22 දිනැති අංක 01/2025 දරන චක්‍රලේඛයේ 03 වැනි ඡේදය	පුහුණු කටයුතු පැවැත්වීම සඳහාම පිහිටුවා ඇති දේශීය රාජ්‍ය ආයතන වෙත පමණක් නිලධාරීන් යොමු කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසිදෙදෙනෙකු පෞද්ගලික පුහුණු ආයතනයක් වෙත යොමු කර රු.293,500ක වියදමක් දරමින් පුහුණු අවස්ථාවන් ලබා දීමට කටයුතු කර තිබුණි.
(iii)	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2018 ජනවාරි 24 දිනැති අංක2/2018 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	දෙපාර්තමේන්තුව විසින් 2025 වර්ෂය සඳහා සකස් කරන ලද මානව සම්පත් සංවර්ධන සැලැස්මෙහි සඳහන් පරිදි සම්පත් දායකයින් යොදාගනිමින් දෙපාර්තමේන්තුව විසින් පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම සිදු කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

4.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

ක්‍රියාකාරී සැලැස්මට අනුව දෙපාර්තමේන්තුව සඳහා සී.සී.ටී.වී. කැමරා පද්ධතියක් සවි කිරීමේ කාර්යය සඳහා රු.3,000,000ක ප්‍රතිපාදනයක් වෙන් කර තිබූ අතර එම කාර්යයෙහි ප්‍රගතිය තෙවන කාර්තුව වන විට සියයට 20ක් ලෙස දක්වා තිබුණ ද සැලසුම් කර පරිදි එම කාර්යය ඉටු කර නොතිබූ බවත් දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ ප්‍රගති වාර්තාවෙන් එම කාර්යය ඉවත් කර තිබූ බවත් නිරීක්ෂණය විය.

4.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(i) දෙපාර්තමේන්තුවේ පාලන ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සහ රසායනාගාර ගොඩනැගිල්ල නවීකරණය කිරීම යන කාර්යයන් වල ප්‍රගතිය පිළිවෙලින් සියයට 98 හා 100 ලෙස වාර්තාවේ දක්වා තිබුණ ද අදාළ භෞතික කාර්යයන් හා ප්‍රසම්පාදන ගොනු පරීක්ෂාවේ දී දෙසැම්බර් 31 දින වන විට දක්වා ඇති ප්‍රගතිය ළඟා කර ගෙන නොතිබූ බව තහවුරු විය.

(ii) පුස්තකාල කළමනාකරණ පද්ධතියට දෙපාර්තමේන්තුවේ පුස්තකාලය සතුව පවතින පොත් පිළිබඳ විස්තර ඇතුළත් කිරීමේ කාර්යය සඳහා සියයට 75ක ප්‍රගතියක් දක්වා තිබුණ ද පුස්තකාලය සතු සමස්ත පොත් සංඛ්‍යාව 7500ක් පමණ වූ අතර 2026 වර්ෂයේ මාර්තු මස වන විට ද පුස්තකාල කළමනාකරණ පද්ධතියට ඇතුළත් කර ඇති පොත් සංඛ්‍යාව 2,000ක් පමණ වූ බැවින් ද ඒ වන විටත් පරීක්ෂා කර බැලීමේ දී දත්ත පද්ධතියට තොරතුරු ඇතුළත් කිරීමේ ගැටළු පවතින බව නිරීක්ෂනය වූ බැවින් ද දක්වා ඇති ප්‍රගතිය නිවැරදි නොවන බව තහවුරු විය.

4.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව කාර්යසාධන වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

4.2 ප්‍රසම්පාදනයන්

(i) දෙපාර්තමේන්තුව විසින් 2024 නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1 ප්‍රකාරව ඉදිරි වසර 03ක කාලයක් සඳහා සකස් කළ යුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබූ අතර මාර්ගෝපදේශ 4.1.3 ප්‍රකාරව අදාළ මූල්‍ය වර්ෂය සඳහා සකස් කරන ලද සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම ද එම මාර්ගෝපදේශයට අනුකූල නොවීය.

(ii) දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.3 ප්‍රකාරව ප්‍රසම්පාදන කළමනාකරණ අංශයක් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබූ අතර ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරියෙක් ද පත් කර නොතිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1.5 අ iv මාර්ගෝපදේශය ප්‍රකාරව සැපයුම්කරුවන් /කොන්ත්‍රාත්කරුවන්/ සේවා සම්පාදකයන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලියාපදිංචි වී නොමැති නම් ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් දුරකථන නාමාවලී / ඊ වාණිජ්‍ය වෙබ් අඩවි සහ වෙළඳපළ තුළින් පිළිගත් සැපයුම්කරුවන් /කොන්ත්‍රාත්කරුවන් / සේවා සම්පාදකයන්ගෙන් මිල ගණන් කැඳවිය හැකි බව සඳහන් වුව ද දෙපාර්තමේන්තුව විසින් 2025 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි.

(iv) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3 මාර්ගෝපදේශය පරිදි මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා සාධාරණ හා ප්‍රමාණවත් කාලයක් ලබා දිය යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් මිල ගණන් කැඳවීම සඳහා ලංසුකරුවන් වෙත යොමු කළ ලිපිවල මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා කාල සීමාවක් සඳහන් කර නොතිබූ අවස්ථා පැවති බව ප්‍රසම්පාදන ගොනු නියැදි පරීක්ෂාවේ දි අනාවරණය විය.

(v) ලංසු විවෘත කිරීමේ කමිටුව විසින් ලංසු විවෘත කරන ලද දින " නියෝජිත ආයතනවලින් කිසිවෙකු පැමිණ සිටියේ නැත" යන්න ලෙස ලංසු විවෘත කිරීමේ වාර්තාවේ සඳහන් කළ ද ලංසු කැඳවීම සඳහා සැපයුම්කරුවන් වෙත යොමු කළ ලිපිවල මිල ගණන් විවෘත කරන දිනය හා වේලාව පිළිබඳව සඳහන් කරමින් සැපයුම්කරුවන් දැනුවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(vi) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.1.5 මාර්ගෝපදේශය ප්‍රකාරව මිල ගණන් මුද්‍රා තැබූ කවර තුළ බහා ඉදිරිපත් කළ යුතු බවට සැපයුම්කරුවන් දැනුවත් කිරීමට කටයුතු කර නොතිබූ බැවින් ප්‍රසම්පාදන කටයුතු වලදී මුද්‍රා නොතිබූ කවර වල ලංසු දෙපාර්තමේන්තුව වෙත භාර ගෙන ඇති අවස්ථා පැවතුණි.

(vii) පාලන හා ගිණුම් අංශ ගොඩනැගිලි අළුත්වැඩියා කටයුතු සම්බන්ධ ප්‍රසම්පාදන ගොනු පරීක්ෂා කිරීමේ දී පහත කරුණු අනාවරණය විය.

(අ) යුධ හමුදා ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවෙන් ලද ඇස්තමේන්තු අනුව අළුත්වැඩියා කටයුතු සිදු කර ඇති අතර යුධ හමුදා ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් අනුමැතිය සඳහන් කරමින් අත්සන්

නොකරන ලද ඇස්තමේන්තුවක් පදනම් කර ගනිමින් ප්‍රසම්පාදන කටයුතු සිදු කර සැපයුම්කරුවෙකුගෙන් රු. 608,490ක වටිනා ගොඩනැගිලි ද්‍රව්‍ය මිලට ගෙන තිබුණි. තවද ඇස්තමේන්තුවේ මුළු එකතුව රු.446,876ක් ලෙස සඳහන් වුවද නිවැරදි ඇස්තමේන්තුවේ මුළු වටිනාකම රු.1,585,078ක් විය.

(ආ) ඉහත ඇස්තමේන්තුවේ සඳහන් වූ අයිතම 12 ක් සඳහා ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු ගත මිල රු. 1,995ත් - රු. 28,632 ත් අතර පරාසයක පැවති අතර සත්‍ය මිල රු. 280ත් -රු.1,580ත් අතර පරාසයක පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තුගත මිලෙහි හා සත්‍ය මිලෙහි රු.1,715ත් - රු.27,052ත් අතර සැලකිය යුතු මිල විචලනයක් පැවතිය ද ඒ පිළිබඳ ලංසු ඇගයීමේ කමිටුව විසින් හෝ ප්‍රසම්පාදන කමිටුව විසින් නිරීක්ෂණයන් ඉදිරිපත් කර නොතිබුණු බවත් ඇස්තමේන්තු තාත්වික නොවන බවත් නිරීක්ෂණය විය.

(ඇ) ඇලුමිනියම් ද්‍රව්‍ය මිල දී ගැනීමට ආයතන 03 කින් ද, විදුලිය හා සම්බන්ධ අළුත්වැඩියා ද්‍රව්‍ය මිල දී ගැනීමට ආයතන 03 කින් ද හා වැසිකිළි නවීකරණ කටයුතු සඳහා අවශ්‍ය ටයිල් හා අනෙකුත් අයිතම මිලදී ගැනීමට ආයතන 03 කින් ද මිල ගණන් කැඳවීම සඳහා සකස් කරන ලද ලිපිවල කාර්යාල පිටපත් ගොනුව තුළ නොතිබුණි. ගොනුවේ 2025 දෙසැම්බර් 17 දිනැති සටහන් අංක 43 හා 44 යටතේ මිල ගණන් කැඳවීම පිළිබඳව සඳහන් කර තිබුණ ද එක් ආයතනයක් වෙතින් මිල ගණන් ඉදිරිපත් කර තිබුණේ 2025 දෙසැම්බර් 12 දිනැතිවය. ඉතිරි ආයතන 05ක් දින රහිතව ද අනෙක් ආයතන 03 දෙසැම්බර් 17 දිනැතිව ද මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. තවද එම ආයතනවලින් ලද මිල ගණන් විවෘත කිරීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 6.6 ප්‍රකාරව ලංසු විවෘත කිරීමේ කමිටුවක් පත් කර නොතිබූ අතර ලංසු විවෘත කිරීමේ කමිටු වාර්තා ලබා ගැනීමෙන් තොරව 2025 දෙසැම්බර් 22 ලංසු ඇගයීමේ කමිටුවේ නිර්දේශ මත මිල දී ගැනීම් සිදු කර තිබුණි.

(viii) ගොඩනැගිලි අළුත්වැඩියාව සඳහා PVC අයිතම සහ ඉදිකිරීම් අයිතම මිල දී ගැනීමට ආයතන 05 කින් මිල ගණන් කැඳවා තිබුණු අතර ඉන් එක් සැපයුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් සහිත ලියවිලි වල අදාළ සැපයුම්කරුගේ බලයලත් පුද්ගලයෙකු විසින් අත්සන් කර නොතිබුණි. දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.7. (අ) මාර්ගෝපදේශයට පටහැනිව අදාළ සැපයුම්කරුගෙන් රු.13,778ක් පිරිවැය වන PVC අයිතම ද රු. 255,800ක් පිරිවැය වන ඉදිකිරීම් අයිතමද මිල දී ගෙන තිබුණි.

(ix) කොන්ත්‍රාත් සඳහා රඳවා ගැනීම් මුදල් ගණනය කිරීමේ දී අත්තිකාරම් මුදල් අඩු කිරීමෙන් පසු වටිනාකම සලකා බලමින් රඳවා ගැනීම් මුදල් ගණනය කිරීම කර තිබූ බැවින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.18 මාර්ගෝපදේශයට අනුකූල නොවුණි.

(x) දෙපාර්තමේන්තුවේ චිත්‍රපට රසායනාගාර ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු 2025 දෙසැම්බර් 31 දින වන විටත් අවසන්ව නොතිබූ අතර අලුත්වැඩියා කටයුතු සිදු කරන ලද පෞද්ගලික ආයතනය වෙනුවෙන් රු. 13,918,669ක වටිනාකමකට අංක 324759 දරන චෙක්පත ලියා 2026 වර්ෂයේ මැයි 11 දින වන විටත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් භාරයේ රඳවාගෙන තිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

ආයතනයේ පුස්තකාල කළමනාකරණ පද්ධතිය, මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතිය, වැඩ ප්‍රවාහ සහ තැපැල් කළමනාකරණ පද්ධතිය (Work Flow and Postal management System) ස්ථාපිත කිරීම වෙනුවෙන් රු. 1,633,781ක මුළු ඉන්වොයිස් වටිනාකම් සඳහාම චෙක්පත් 02ක් 2024 දෙසැම්බර් 30 දිනැතිව පිළියෙළ කර දෙපාර්තමේන්තු නිලධාරියෙකු භාරයේ රඳවා තබා ගෙන 2025 මැයි මස 28 දින පොදු තැම්පතු ගිණුමේ තැන්පත් කිරීමට කටයුතු කර තිබුණි. ඉහත දත්ත පද්ධති මෙම වාර්තාවේ දින වන තෙක්ම භාවිතා කළ හැකි පරිදි සංවර්ධනය කර දෙපාර්තමේන්තුවට භාර දීමට ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය කටයුතු කර නොතිබූ අතර අදාළ සේවාවන් ලබා ගැනීම සම්බන්ධව ආයතනය සමග ගිවිසුම්වලට එළඹීම ද සිදු කර නොතිබුණි.

4.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

දෙපාර්තමේන්තුවේ රජයේ චිත්‍රපට අංශය යටතේ ස්ථාපිත කැමරා අංශයේ සහ ඡායාරූප අංශයේ නිලධාරීන් නව දෙනෙකු වෙත රාජකාරී කටයුතු සඳහා භාවිතා කිරීමට කැමරා හා අවශ්‍ය සෙසු උපකරණ ඉන්වෙන්ට්‍රි පොත් මගින් එම නිලධාරීන්ට ලබා දී තිබූ අතර කැමරා අංශයේ එක් නිලධාරියෙකුට ලබා දී තිබූ කැමරා ඇතුළු අනෙකුත්

උපකරණවල ආසන්න වටිනාකම රු.5,000,000ක් පමණ වන බව අනාවරණය විය. මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව එම නිලධාරීන් බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම යටතේ කටයුතු පවරනු ලැබ ඇති බැවින් රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූව ඇප තැබිය යුතු වුව ද දෙපාර්තමේන්තුව විසින් ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.5 කළමනා කරණ දුර්වලතා

(i) දෙපාර්තමේන්තුවේ සේවය කරන, 2023 වර්ෂයේ ප්‍රාථමික ශ්‍රේණියේ පත්වීම් ලද නිලධාරීන් සිව් දෙනෙකුගෙන් ඔවුන් පත්වීම් ලද දිනයේ සිට ගෙවන ලද වැටුපෙන් වැන්දඹු හා අනත්දරු දායක මුදල් අයකර නොමැති බව පුද්ගල පඩි නඩි ලේඛන පරීක්ෂා කිරීමේ දී අනාවරණය වූ අතර විගණිත දිනට එම නිලධාරීන්ගෙන් අයකර ගත යුතු මුළු වැන්දඹු හා අනත්දරු දායක මුදල් ප්‍රමාණය රු. 220,000ක් විය.

(ii) තාක්ෂණික දැනුම අවශ්‍ය දෙපාර්තමේන්තුගත තනතුරු පුරප්පාඩුව පැවතීම සහ අදාළ තනතුරු දරන ලද නිලධාරීන් 2022 ජුනි 22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022ට අනුව දේශීය / විදේශීය නිවාඩු ලබා ගෙන තිබීම හේතුවෙන් දෙපාර්තමේන්තුව විසින් රු.420,600ක පිරිවැයක් දරමින් දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා ගැනීමේ පුහුණු අවස්ථා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ඒකාබද්ධ සේවයේ තනතුරු දරන නිලධාරින් වෙත ලබා දී තිබූ අතර එම නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරු මත වෙනත් ආයතන වෙත යාමේ හැකියාවක් පවතින බැවින් එම පුහුණු පිරිවැය දෙපාර්තමේන්තුවට ඵලදායි ලෙස යොදා ගැනීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණි.

5 යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

2013 සැප්තැම්බර් 24 දිනැති අංක DMS/C/6/44/01-(Vol-lll) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය මගින් දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත කර තිබුණ ද 2026 වර්ෂයේ මැයි 11 දින වන විටත් ස්ථිර පදනමින් අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කොට නොතිබුණි. එම තනතුරේ රාජකාරී ආවරණය සඳහා වෙනත් දෙපාර්තමේන්තුවක ප්‍රධාන ගණකාධිකාරිවරයෙක් පත්කොට තිබූ අතර වසර 12ක පමණ කාලය සිට අභ්‍යන්තර විගණන තනතුර ස්ථිර පදනමින් පත්කොට නොතිබුණි. තවද මෙය 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි 40 (i) වගන්තියට අනුකූල නොවුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(i) ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ කාර්යභාරය විධිමත් රාජකාරි පැවරුම් ලැයිස්තුවක් මගින් හෝ පනතක් / ගැසට් නිවේදනයක් මගින් බලාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැරව ප්‍රවෘත්ති නිලධාරි තනතුරු 21ක ද මාධ්‍ය විමර්ශන සහකාර තනතුරු 10ක ද, වෙබ් ලේඛක තනතුරු 04ක ද නිලධාරීන් දෙපාර්තමේන්තුව තුළ සේවය කරන බව ද අනියම් (දෛනික) පදනම මත කාර්යාල කම්කරු තනතුරේ ද සේවයකයෙකු සේවය කරන බව ද අනාවරණය විය.



එච්.ඒ.යූ.ඩී.සරත් කුමාර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04 පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (2025 ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක		අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම්		
		100%- 90%	89%-51%	50% - 10%
ප්‍රවෘත්ති සාකච්ඡා සංවිධානය				
කැබිනට් තීරණ දැනුම් දීමේ ප්‍රවෘත්ති සාකච්ඡා සංවිධානය කිරීම			84%	
කැබිනට් මාධ්‍ය ප්‍රකාශය සජීවී පටිගත කිරීම, ප්‍රවාහය හා ප්‍රචාරය කිරීම		100%		
රජයේ විශේෂිත වැඩසටහන් පිළිබඳව ප්‍රවෘත්ති සාකච්ඡා සංවිධානය		100%		
මාධ්‍ය ආවරණ සිදු කිරීම				
ප්‍රචාරණ ඒකකය මඟින් වෙනත් ආයතන විසින් පවත්වන මාධ්‍ය සාකච්ඡා/ මාධ්‍ය ආවරණ සම්බන්ධීකරණය		100%		
වීඩියෝ කැමරා ඒකකය මඟින් සහ ඡායාරූප ඒකකය මඟින් සිදු කරන ප්‍රවෘත්ති ආවරණ/ මාධ්‍ය ආවරණ		100%		
රජයේ සංවර්ධන වැඩසටහන් සම්බන්ධයෙන් හා විශේෂ අවස්ථා අනුව මාධ්‍ය නිරීක්ෂණ චාරිකා සංවිධානය කිරීම		100%		
දිස්ත්‍රික් මාධ්‍ය ඒකක මඟින් සිදුකරන ප්‍රවෘත්ති ආවරණ		100%		
ජාතික හා ජාත්‍යන්තර උත්සව අවස්ථා මාධ්‍ය සම්බන්ධීකරණය හා මාධ්‍ය ආවරණය		100%		
සමාජ මාධ්‍ය යාවත්කාලීන කිරීම				
භාෂා ත්‍රිත්වයෙන් වෙබ් අඩවි යාවත්කාලීන කිරීම	www.dgi.gov.lk	100%		
	www.news.lk	100%		
DGI හා News.lk	Facebook	100%		
	YouTube	100%		
දිස්ත්‍රික් මාධ්‍ය ඒකක	Facebook	100%		
රජයේ චිත්‍රපට අංශය	YouTube	100%		
නිෂ්පාදන කටයුතු				
වාර්තා චිත්‍රපට, සාකච්ඡාමය වැඩසටහන් හා කෙටි වීඩියෝ වැඩසටහන් නිෂ්පාදනය		100%		
රජයේ වීඩියෝ දැන්වීම් නිෂ්පාදනය		100%		
අමාත්‍ය මණ්ඩල තීරණ හා විශේෂිත මාධ්‍ය සාකච්ඡා සංඥා භාෂාවෙන් සහ දමිල භාෂාවෙන් නිෂ්පාදනය		100%		

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම්		
	100%- 90%	89%-51%	50% - 10%
ප්‍රකාශන පළ කිරීම හා වාර්තා සකස් කිරීම			
දෙසතිය සඟරාව පළ කිරීම	100%		
ජාතික මාධ්‍ය සංකථන කෘතියේ 5 වන වෙළුම ප්‍රකාශයට පත් කිරීම	100%		
දිනපතා ශ්‍රව්‍ය,දෘශ්‍ය, මුද්‍රිත මාධ්‍ය හා හා සමාජ මාධ්‍ය ඇසුරෙන් විශ්ලේෂණ වාර්තා සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකස් කිරිම	99%		
ජනමාධ්‍ය ප්‍රවර්ධනය හා පුහුණු සංවිධානය			
පාසල් සිසුන් සහ ගුරුවරුන් සඳහා දේශන පැවැත්වීම	100%		
පොත් කට්ටල සහ බිත්ති පුවත්පත් 20 බැගින් පාසල්වලට බෙදා හැරීම		75%	
පාසල් සිසුන් සඳහා කෙටි කතා හා කෙටි චිත්‍රපට තරඟ සංවිධානය කිරීම	100%		
ජනමාධ්‍යවේදීන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම	91%		
මාධ්‍යවේදීන් සඳහා වැඩමුළු සංවිධානය කිරීම.	100%		
විශ්ව විද්‍යාල ශිෂ්‍ය පර්යේෂණ නිබන්ධන සඳහා, පුහුණුව ලබන විශ්ව විද්‍යාල සිසුන් සහ ක්ෂේත්‍රයට පැමිණෙන පාසල් සිසුන් සඳහා අවශ්‍ය නිදර්ශන සහ ප්‍රායෝගික පුහුණු සැපයීම	100%		
දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.	100%		
ඡායාරූප චිත්‍රපට සංරක්ෂණය			
ඡායාරූප පුස්තකාලයේ පැරණි ඡායාරූප නෙගටිව් ස්කෑන් කිරීම (ඡායාරූප සංරක්ෂණය) හා ස්ථිර උපස්ථ වෙත සියලුම ඡායාරූප සුරැකීම	100%		
ඩිජිටල් ඡායාරූප ආවරණ ඡායාරූප පුස්තකාලයේ ගබඩා කිරීම	100%		
රජයේ චිත්‍රපට අංශය සතු වාර්තා සහ ප්‍රවෘත්ති චිත්‍රපට සංරක්ෂණයට අදාළ චිත්‍රපට කෝණ පිරිසිදු කිරීම සහ ඩිජිටල් මාධ්‍ය බවට පරිවර්තනය කිරීම	100%		
මාධ්‍ය හැඳුනුම්පත් ඒකකය			
ජනමාධ්‍යවේදීන්ට මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම	91%		
කාර්යාලීය හැඳුනුම්පත් නිකුත් කිරීම	95%		
විශේෂ අවස්ථාවලදී මාධ්‍යවේදීන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම.	100%		

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම්		
	100%- 90%	**89%-51%**	**50% - 10%**
නිලධාරීන් පුහුණු කිරීම			
පාලන හා ගිණුම් අංශයේ නිලධාරීන් පුහුණු කිරීම	100%		
මාධ්‍ය ප්‍රචාරණයට සම්බන්ධ නිලධාරීන් පුහුණු කිරීම	100%		
රජයේ චිත්‍රපට අංශයේ නිලධාරීන් පුහුණු කිරීම	100%		

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

අරමුණ	ඉලක්ක (ගෝලීය ඉලක්කය)	සාක්ෂාත් කර ගැනීම සඳහා වන දර්ශක	වර්තමානය වන විට සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
4 වන අරමුණ: ගුණාත්මක අධ්‍යාපනයක්	**4.4 වන ඉලක්කය:** සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් ඇතුළුව අදාළ කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම.	**පරිපාලන, මාධ්‍ය සහ GFU ක්ෂේත්‍ර ඔස්සේ දෙපාර්තමේන්තු නිලධාරීන් 88 දෙනෙකුගේ කුසලතා වර්ධනය කිරීම.** (1.8 ව්‍යාපෘතිය)		✓	
	4.7 වන ඉලක්කය: ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම සහ කුසලතාවන් ලබාගෙන සිටීම. එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය සහ ප්‍රචණ්ඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිකමය වශයෙන් දායක වීම ඇතුළත් වේ.	**මාධ්‍ය වැඩමුළු සහ වැඩසටහන් 10 ක් සාර්ථකව නිම කිරීම.** (2.1.3.3 ව්‍යාපෘතිය)			✓
		ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සඳහා මාධ්‍ය සාක්ෂරතා වැඩමුළු 10 ක් නිම කිරීම. (2.2.4.1 ව්‍යාපෘතිය)			✓
		සාමාන්‍ය පෙළ (O/L) සහ උසස් පෙළ (A/L) සිසුන් සඳහා මාසික මාධ්‍ය සාක්ෂරතා දේශන 8 ක් පවත්වා අවසන් කිරීම. (2.8.5.1 ව්‍යාපෘතිය)			✓
		පාසල් මාධ්‍ය සමාජ පුරා කෙටිකතා, සිනමාපට නිර්මාණය සහ ඡායාරූපකරණ තරඟ ක්‍රියාත්මක කිරීම. (2.8.3.1 ව්‍යාපෘතිය)			✓

අරමුණ	ඉලක්ක (ගෝලීය ඉලක්කය)	සාක්ෂාත් කර ගැනීම සඳහා වන දර්ශක	වර්තමානය වන විට සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
9 වන අරමුණ: කර්මාන්ත, නවෝත්පාදන හා යටිතල පහසුකම්	**9.1 වන ඉලක්කය:** ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශ විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදුකරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.	**පරිපාලන, මාධ්‍ය සංවර්ධන, රසායනාගාර සහ සිනමා සංරක්ෂණ ගොඩනැගිලිවල ව්‍යුහාත්මක නවීකරණ කටයුතු 80% ක් නිම කිරීම.** (1.1 ව්‍යාපෘතිය)			✓
		ආරක්ෂාව සහ බලශක්ති ස්ථාවරත්වය සඳහා විදුලි රැහැන් යටිතල පහසුකම් සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කිරීම. (1.1 ව්‍යාපෘතිය)			✓
	9.4 වන ඉලක්කය: යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ කර්මාන්ත තිරසර කිරීම සඳහා නව තාක්ෂණය මගින් සංවර්ධනය කිරීම. කර්මාන්ත ක්‍රියාවලියේදී සම්පත් කාර්යක්ෂම ආකාරයට භාවිතා කිරීම වැඩිදියුණු කිරීම සහ පිරිසිදු සහ පරිසරයට සුදුසු ගුණාත්මකභාවයෙන් ඉහළ තාක්ෂණයන් උපයෝගී කරගැනීමට සියලුම රටවල් ඔවුන්ට පවත්නා ධාරිතාවන් අනුව මේ සම්බන්ධයෙන්පියවර ගැනීම.	**ඇනලොග් සිනමා පට** (analog film reels) **නවීන ඩිජිටල් ආකෘතීන් වෙත සම්පූර්ණයෙන්ම පරිවර්තනය කිරීම (වීඩියෝ** 1,919 **ක් සහ නෙගටිව් පට** 2,239 **ක් සංරක්ෂණය කරන ලදී).** (3.2.1 සහ 3.2.7 ව්‍යාපෘති)			✓
12 වන අරමුණ: වගකීමෙන් යුතු පරිභෝජනය සහ නිෂ්පාදනය	**12.5 වන ඉලක්කය:** අපද්‍රව්‍ය උත්පාදනය වීම වැළැක්වීම, අඩුකිරීම, ප්‍රතිචක්‍රීයකරණය සහ ඒවා නැවත භාවිතා කිරීම මගින් අඩු කිරීම.	**භෞතික මාධ්‍ය අපද්‍රව්‍ය අවම කිරීම සඳහා, වීඩියෝ/ශ්‍රව්‍ය දෘශ්‍ය වත්කම්** 371**ක්** 100%**ක්** cloud **සබැඳි** (cloud links) **හරහා මාධ්‍ය බෙදා හැරීම.** (2.1.3.2 ව්‍යාපෘතිය)			✓

අරමුණ	ඉලක්ක (ගෝලීය ඉලක්කය)	සාක්ෂාත් කර ගැනීම සඳහා වන දර්ශක	වර්තමානය වන විට සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	**50% - 74%**	**75% - 100%**
16 වන අරමුණ: සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන	**16.6 වන ඉලක්කය:** සියලුම මට්ටම්වලදී ඵලදායී වගවීමෙන් යුක්ත සහ විනිවිදභාවයෙන් යුත් ආයතන පිහිටුවීම.	**කැබිනට් මාධ්‍ය සාකච්ඡා 45ක් සහ වෙනත් මාධ්‍ය සාකච්ඡා 124 ක් සාර්ථකව සම්බන්ධීකරණය කිරීම.** (2.1.1 ව්‍යාපෘතිය)			✓
	16.10 වන ඉලක්කය: ජාතික නීති පද්ධතියට සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්, ගිවිසුම්වලට අනුකූලව මහජනතාවට තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම සහ මූලික නිදහස ආරක්ෂා කිරීම තහවුරු කිරීම.	**රජයේ නිල නිවේදන සහ මාධ්‍ය නිවේදන 1,273 ක් බෙදා හැරීම.** (2.1.3.1 ව්‍යාපෘතිය)			✓
		කැබිනට් මාධ්‍ය සාකච්ඡා 45ක් සඳහා සංඥා භාෂාව සහ දෙමළ පරිවර්තන ඇතුළත් කිරීම. (3.1.5 ව්‍යාපෘතිය)			✓
		නිල පනත් සහ ගැසට් පත්‍ර මහජනතාවට ලබා ගැනීමට සැලැස්වීම / ආදායම් උත්පාදනය. (2.12.1.2 ව්‍යාපෘතිය)			✓
		පැරණි වාර්තා සිනමාපට, ප්‍රවෘත්ති පට (newsreels) සහ ඡායාරූප නෙගටිව් නවීකරණය කිරීම සහ 100% ක් ඩිජිටල්කරණය කිරීම. (3.2.12 ව්‍යාපෘතිය)			✓

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ

1. **ආයතනික යටිතල පහසුකම් පුනර්ජීවනය (ඉලක්කය 9):** පරිපාලන ගොඩනැගිල්ල, මාධ්‍ය සංවර්ධන මධ්‍යස්ථානය, පැරණි ශ්‍රවණාගාරය සහ චිත්‍රපට සහ ඩිජිටල් සංරක්ෂණ ඒකකය පුළුල් ලෙස ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණයකට ලක් කරමින් රාජ්‍ය වත්කම් සාර්ථකව නවීකරණය කරන ලදී. පැරණි විදුලි රැහැන් ප්‍රතිස්ථාපනය කිරීම මගින් ආරක්ෂාව ශක්තිමත් කළ අතර, භෞතික වත්කම් ආරක්ෂා කිරීම සඳහා වාහන නැවැත්වීමේ වානේ පියස්සක් ඉදිකරන ලදී.

2. **භාෂාමය විවිධත්වයන් සහිත කණ්ඩායම් වෙත රජයේ ප්‍රතිපත්ති සඳහා බාධාවකින් තොරව ප්‍රවේශ වීමේ හැකියාව තහවුරු කිරීම. (ඉලක්කය 4 සහ 10):** භාෂාමය විවිධත්වයන් සහිත කණ්ඩායම් වෙත රජයේ ප්‍රතිපත්ති සඳහා බාධාවකින් තොරව ප්‍රවේශ වීමේ හැකියාව තහවුරු කරමින්, කැබිනට් මාධ්‍ය සාක 45ක් සහ විශේෂ වැඩසටහන් විකාශන සඳහා සංඥා භාෂා අර්ථකථනය සහ දෙමළ පරිවර්තන සැපයීම මගින් මහජන සන්නිවේදනයේ සාධාරණත්වය ඉටු කරන ලදී.

3. **සමාජ මාධ්‍ය වේදිකා මගින් විශාල ග්‍රාහක පිරිසක් වෙත ප්‍රවේශ වීමට හැකි වීම. (ඉලක්ක 16 සහ 12):** ඩිජිටල් යුගය තුළ මහජන තොරතුරු විනිවිදභාවය පුළුල් කරමින්, සමාජ මාධ්‍ය වේදිකා හරහා විශාල ග්‍රාහක පිරිසක් වෙත ප්‍රවේශ වීමට හැකි වී තිබේ. (ඒ අනුව, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ Facebook පිටුව මගින් මිලියන 81.3ක ග්‍රාහක ප්‍රවේශයක්, News.lk Facebook පිටුව මගින් මිලියන 80ක ග්‍රාහක ප්‍රවේශයක් සහ දිස්ත්‍රික් මාධ්‍ය Facebook පිටු මගින් මිලියන 18.5ක ග්‍රාහක ප්‍රවේශයක් ලබා ඇත) ඩිජිටල් සංරක්ෂණ කටයුතු යටතේ, Adobe Photoshop සහ Adobe Bridge භාවිතයෙන් දත්ත සම්පත් 3,568ක් සාර්ථකව සැකසූ අතර, ජාතික වශයෙන් සුවිශේෂී පුද්ගලයන් සම්බන් වාර්තා චිත්‍රපට 53ක් සංරක්ෂණය කරන ලදී.

4. **වෘත්තීය ජනමාධ්‍යවේදය විධිමත් කිරීම (ඉලක්කය 16):** ආයතනගත සහ ප්‍රාදේශීය මාධ්‍යවේදීන් / මාධ්‍ය වෘත්තිකයන් / මාධ්‍ය නිලධාරීන් වෙත මාධ්‍ය හැඳුනුම්පත් 4,110ක් නිකුත් කිරීම මගින් මාධ්‍යවේදීන්ගේ වෘත්තීමයභාවය තවදුරටත් ශක්තිමත් කරන ලද අතර, පනත් සහ ගැසට් පත්‍ර මුද්‍රණය කොට අලෙවිය කර ඒ පිළිබඳ මහජන දැනුවත්භාවය වර්ධනය කරන ලද අතර රුපියල් මිලියන 4.1ක රාජ්‍ය ආදායමක් උපයා ගන්නා ලදී.

5. **පාසල් සිසුන්ගේ මාධ්‍ය සාක්ෂරතාවය සහ නිර්මාණාත්මක සහභාගීත්වය ඉහළ නැංවීම (ඉලක්කය 4):** පාසල් මාධ්‍ය සංගම්වල සිසුන්ගේ සන්නිවේදන කුසලතා වර්ධනය කිරීම සඳහා කෙටිකතා, කෙටි චිත්‍රපට, ඡායාරූපකරණය, තිරරචනය සහ නිවේදන තරග ඇතුළත් තරගාවලිය සාර්ථකව අවසන් කරන ලදී.

6. **මාධ්‍යවේදීන්ගේ කුසලතා වර්ධනය (ඉලක්කය 4):** ප්‍රාදේශීය මාධ්‍ය වාර්තාකරුවන් සඳහා විශේෂිත පුහුණු වැඩසටහන් 10ක් සහ Zoom දේශන 8ක් පවත්වා, මූලික මට්ටමේ අධ්‍යාපනය සහ වෘත්තීය හැකියාවන් ශක්තිමත් කිරීමට සෘජුවම දායකවන ලදී.

7. **මහජන තොරතුරු විනිවිදභාවය සහ බෙදා හැරීම ශක්තිමත් කිරීම. (ඉලක්කය 16):** මාධ්‍ය සාකච්ඡා 170කට අධික ප්‍රමාණයක් සංවිධානය කිරීමෙන් සහ සමාජ මාධ්‍ය ජාල හරහා ජරයේ තොරතුරු හා ප්‍රතිපත්ති සෘජුවම ජනතාව වෙත සන්නිවේදනය කිරීමෙන් මහජන වගවීම බාධාවකින් තොරව තහවුරු කරන ලදී.

8. **ඩිජිටල් සංරක්ෂණය ශක්තිමත් කිරීම (ඉලක්ක 9 සහ 12):** පැරණි ඡායාරූප නෙගටිව් 2,239ක් ස්කෑන් කිරීම, ඩිජිටල් වීඩියෝ දර්ශන 1,919ක් සංරක්ෂණය කිරීම සහ වාර්තා චිත්‍රපට ඩිජිටල්කරණය කිරීම මගින් පැරණි මාධ්‍ය සම්පත්වල අඛණ්ඩතාව සුරක්ෂිත කිරීමට කටයුතුර කරන ලදී.

තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ මුහුණ දුන් අභියෝග

1. ආපදා තත්ත්වයන් මත ඇති වූ බාධා: දිට්වා සුළි කුණාටුව මගින් ඇති වූ දැඩි ආපදා තත්ත්වයන් හේතුවෙන් වසර අවසානයේ සැලසුම්කර තිබූ ක්‍රියාකාරකම්වලට යම් බාධා ඇති ලක් විය. කෙසේනමුත් 90%ක පමණ සාමාන්‍ය ප්‍රගතියක් වර්ෂාවසානය වන විට ලබා ගැනීමට හැකි වී ඇත.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	19	08 + (වැ.බ. -01)	11	-
තෘතීයික	16	02	14	-
ද්විතියික	303	204	99	-
ප්‍රාථමික	52	37	15	-
කොන්ත්‍රාත්	13	-	13	-
එකතුව	**403**	**251** + (වැ.බ. -01)	**152**	**-**

*2025.12.31 දිනට අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූව ද ජාතික මාධ්‍ය මධ්‍යස්ථානයෙන් පැමිණි නිලධාරීන් 35ක් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවාවන්හි නිරත විය.

අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ නිලධාරීන්

ප්‍රවෘත්ති නිලධාරී	21
මාධ්‍ය විමර්ශන සහකාර	10
වෙබ් ලේඛක	04
එකතුව	**35**

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපෑම.

තෘතීයික මට්ටමේ සහ ද්විතියික මට්ටමේ මානව සම්පත් හිඟය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය උදෙසා සෘජුවම බලපා ඇත. විශේෂයෙන් තාක්ෂණික කාර්යභාරය ඉටු කරන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතීම හේතුවෙන් දෛනික රාජකාරී කටයුතු ඉටු කර ගැනීමේදී අපහසුතාවයක් පවතී. ඒ සඳහා දෙපාර්තමේන්තුගත තනතුරුවල සේවයේ යෙදී සිටි දැනුම සහ කුසලතාවයෙන් යුතු නිලධාරීන් විශ්‍රාම යාම ප්‍රධානම හේතුව වී ඇත. නවක නිලධාරීන්ට එම පුහුණුව ලබා දීමට විශාල කාලයක් ගත වනු ඇත. එසේම එම තනතුරුවල පුරප්පාඩු සඳහා උසස්වීම් ලබා දීමට ඇති බාධා හේතුවෙන් ද මේවන විට විවිධ මට්ටම්වල තනතුරු සඳහා නිලධාරී හිඟයක් ඇති වී තිබේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය /විදේශීය)	නිමැවුම / ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
Media & Think tank summit in China	01	2025.07.22 – 2026.07.28	-	150 US $	විදේශීය	විදේශ මාධ්‍ය ක්ෂේත්‍රයේ දැනුම
Media Training Programme in India	24	2025.08.17 - 2025.08.30	-	8400 US $ (350 US $ x 24)	විදේශීය	විදේශ මාධ්‍ය ක්ෂේත්‍රයේ දැනුම
Seminar on new productive forces in media of Indian Ocean Region Countries in China	01	2025.10.28 - 2025.11.13	-	375 US $	විදේශීය	විදේශ මාධ්‍ය ක්ෂේත්‍රයේ දැනුම

ඉහත සඳහන් විදේශීය පුහුණු අවස්ථාවලට අමතරව දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 88දෙනෙකු සඳහා පහත සඳහන් දේශීය පුහුණු අවස්ථාවන් ද ලබා දී ඇත.

අ/අ	පුහුණු වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව
01.	Essential Photoshop & Social Media Video Creation පාඨමාලාව	12
02.	නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා ප්‍රසම්පාදන සැලැස්ම	24
03.	අභ්‍යයන්තර විගණන පරිචය	01
04.	Advance Drone Piloting	01
05	විද්‍යාත්මක පිරිමැස්මදායක සහ ආරක්ෂිත රිය පැදවීම	02
06.	සාමාන්‍ය කාර්යාල පරිපාලනය,කාර්යාල සටහන් ලිවීම හා ආයතන සංග්‍රහය මුදල් රෙගුලාසි	22

අ/අ	පුහුණු වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව
07.	නිවාඩු භාර නිලධාරියාගේ වගකීම හා කාර්යභාරය හා සංවර්ධන නිලධාරි කුසලතා වර්ධනය	03
08.	ඩිජිටල් ශබ්ද පටිගත කිරීමේ පද්ධති පිළිබඳ පාඨමාලාව	11
09.	තොරතුරු තාක්ෂණයට අදාළ භාණ්ඩ ප්‍රසම්පාදනය	03
10.	3D – Animation & VFX	01
11.	පරිපාලන නිලධාරි ධාරිතා සංවර්ධනය	01
12.	ගබඩා කළමනාකරණය	01
13.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ	01
14.	වැටුප් පරිවර්තනය පිළිබඳ වැඩ මුළුව	04
15.	ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීම හා පවත්වාගෙන යාම	01
එකතුව		88

6.4 ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායකත්වය

රාජ්‍ය සේවයට නවක පත්වීම් ලද නිලධාරීන් අනුයුක්ත කර සිටින අංශවලට හා පවරනු ලබන රාජකාරීවලට අදාළව බාහිර ආයතන මඟින් නිසි පුහුණුවක් ලබා දීම තුළින් තම රාජකාරී නිවැරදිව, ක්‍රමානුකූලව හා කාර්යක්ෂමතාවයෙන් යුතුව ඉටු කිරීමට හැකියාව ලැබී ඇත. එසේම කාර්ය මණ්ඩල අභිප්‍රේරණයක් ළඟා කර ගැනීම මෙමඟින් අපේක්ෂිතය.

තවද මෙම පුහුණු පාඨමාලා තුළින් නිලධාරීන්ට රාජකාරී පරිසරයේ ඒකාකාරී බවින් මිදීමට, නව දැනුම උකහා ගැනීමට හා ඔවුන්ගේ හැකියාවන් වැඩිදියුණු කර ගැනීමට අවස්ථාව ලැබී තිබේ.

නිලධාරීන් පුහුණු පාඨමාලාවන්ට යොමු කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ඉහළ නැංවීමට හැකියාව ලැබී ඇත.

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ	-	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ	-	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ	-	-
1.6	වෙනත්	අදාළ නොවේ	-	-
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ	-	-
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.4	2014.05.11 දිනැති 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
4.6	කාර්තු වාර්තා නියමිත දිනට මහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල නොවේ	අදාළ අංශ/ ඒකක වෙතින් පිළිතුරු ලබා දීමට ප්‍රමාද වීම	අදාළ අංශ/ ඒකක වෙතින් නියමිත දිනට පිළිතුරු ලබා ගැනීමට කටයුතු කිරීම
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	අදාළ අංශ/ ඒකක වෙතින් මාසයක කාලයක් තුළ පිළිතුරු ලබා නොදීම	විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදී දැනුවත් කිරීමට කටයුතු කිරීම

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ	-	-
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල නොවේ	අතිරික්තතා සම්බන්ධ කටයුතු සිදු කර ඇති අතර ඌනතා පිළිබඳ විමර්ශන කමිටු වාර්තා මෙතෙක් ලැබී නොමැත	කමිටු වාර්තාව නිසි පරිදි ඉදිරිපත් වූ පසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ	-	-
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ	-	-
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ	-	-
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහ ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාළ නොවේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායෙ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ	-	-
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම.	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ	-	-
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	අදාළ ණය මුදල් ගෙවීමට කටයුතු කර නොමැත	ණය මුදල් අදාළ පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට කටයුතු කිරීම
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ	-	-
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාරිය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ	-	-
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ	-	-
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ	-	-
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ	-	-
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම	අනුකූල වේ	-	-
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ	-	-
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ	-	-
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අදාළ නොවේ	-	-
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ	-	-
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල නොවේ	-	අදාළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති ඇතැම් අඩුපාඩු නිවැරදි කර ඇති අතර අනෙකුත් අඩුපාඩු නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී.

අවසානය

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, රජයේ නිල තොරතුරු සන්නිවේදන ආයතනයක ලෙස, රජයේ ප්‍රතිපත්ති, සංවර්ධන වැඩසටහන්, ජාතික වැදගත්කමකින් යුත් කාලීන සිදුවීම් සහ මහජන උනන්දුවට අදාළ තොරතුරු නිවැරදි, විශ්වසනීය, කාලෝචිත සහ වගකීම්සහගත ආකාරයෙන් ජනතාව වෙත සන්නිවේදනය කිරීමේ ජාතික වගකීම ඉටු කරමින් සිටී. 2025 වර්ෂය තුළ ද එම වගකීම සාර්ථකව ඉටු කරමින්, තොරතුරු සන්නිවේදන ක්ෂේත්‍රයේ සිදුවන වේගවත් තාක්ෂණික හා සමාජීය වෙනස්කම්වලට අනුගත වෙමින්, නව ප්‍රවේශයන් සහ නවෝත්පාදන ක්‍රියාමාර්ග හඳුන්වාදීමට දෙපාර්තමේන්තුව සමත් විය.

වර්තමාන තොරතුරු සමාජය තුළ සාවද්‍ය තොරතුරු, ව්‍යාජ ප්‍රවෘත්ති සහ තහවුරු නොකළ අන්තර්ගතයන් සීඝ්‍රයෙන් සංසරණය වන පරිසරයක් තුළ, ජනතාවට නිවැරදි හා විශ්වසනීය තොරතුරු සපයන ප්‍රධාන රාජ්‍ය මූලාශ්‍රය ලෙස දෙපාර්තමේන්තුවේ කාර්යභාරය තවදුරටත් වැදගත් වී ඇත. එම අභියෝග හමුවේ, නව මාධ්‍ය, සමාජ මාධ්‍ය සහ ඩිජිටල් වේදිකා කාර්යක්ෂමව භාවිත කරමින් රජයේ නිල තොරතුරු ජනතාව වෙත කඩිනමින් සහ පුළුල් ලෙස සන්නිවේදනය කිරීමට හැකිවීම මෙම වසරේ ලැබූ සුවිශේෂී ජයග්‍රහණයකි. නිල වෙබ් අඩවි, සමාජ මාධ්‍ය ජාල, සජීවී විකාශන සහ බහුමාධ්‍ය අන්තර්ගතයන් හරහා මහජනතාව සමඟ සෘජු සන්නිවේදන සබඳතාවක් ගොඩනැගීමට සහ එය ශක්තිමත් කිරීමට දෙපාර්තමේන්තුව සමත් වී ඇත.

එමෙන්ම, රජයේ ප්‍රතිපත්ති හා සංවර්ධන වැඩසටහන් පිළිබඳ තොරතුරු මාධ්‍ය ආයතන වෙත කාර්යක්ෂමව ලබාදීම, කැබිනට් මාධ්‍ය හමුවල සහ අනෙකුත් ජාතික වැදගත්කමකින් යුත් මාධ්‍ය සිදුවීම්වල සම්බන්ධීකරණය, දේශීය හා විදේශීය මාධ්‍යවේදීන් සමඟ සබඳතා ශක්තිමත් කිරීම සහ රාජ්‍ය ආයතන අතර තොරතුරු හුවමාරුව වඩාත් විධිමත් කිරීම මඟින් රාජ්‍ය තොරතුරු කළමනාකරණ ක්ෂේත්‍රයට සැලකිය යුතු දායකත්වයක් ලබාදීමට හැකි විය.

2025 වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ඩිජිටල් පරිවර්තන ක්‍රියාවලීන්, වාර්තාගත දත්ත පද්ධති භාවිතය, Cloud තාක්ෂණය මත පදනම් වූ තොරතුරු බෙදාහැරීමේ ක්‍රමවේදයන්, මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීමේ නවීකරණය සහ අභ්‍යන්තර පරිපාලන පද්ධති සංවර්ධනය ආයතනයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට සෘජුවම දායක වී ඇත. එසේම, ඓතිහාසික වටිනාකමකින් යුත් චිත්‍රපට, වීඩියෝ දර්ශන සහ ඡායාරූප ඩිජිටල් තාක්ෂණය ඔස්සේ සංරක්ෂණය කිරීම මඟින් ජාතික මාධ්‍ය උරුමය අනාගත පරපුර සඳහා සුරක්ෂිත කිරීමට ද වැදගත් පියවර ගෙන ඇත.

දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන වියදම් ක්‍රියාත්මක කිරීමේදී ද ඉහළ ප්‍රගතියක් වාර්තා කරමින් යටිතල පහසුකම් නවීකරණය, ගොඩනැගිලි අලුත්වැඩියා කටයුතු, නව තාක්ෂණික උපකරණ අත්පත් කර ගැනීම සහ සේවා පරිසරය වැඩිදියුණු කිරීම සඳහා සැලකිය යුතු ආයෝජන සිදු කර ඇත. මෙම

ආයෝජන මඟින් ආයතනයේ දිගුකාලීන ක්‍රියාකාරීත්වය සහ සේවා ගුණාත්මකභාවය තවදුරටත් ශක්තිමත් වනු ඇත.

එසේම, තොරතුරු සන්නිවේදනය යනු හුදෙක් ප්‍රවෘත්ති ප්‍රචාරණය පමණක් නොව, රාජ්‍ය සහ මහජනතාව අතර විශ්වාසය ගොඩනැඟීමේ මූලික මෙවලමක් බව දෙපාර්තමේන්තුව තරයේ විශ්වාස කරයි. එබැවින් ජනතා අයිතිවාසිකම්, ප්‍රජා සහභාගීත්වය, විනිවිදභාවය සහ වගවීම යන මූලධර්ම ශක්තිමත් කිරීම සඳහා ද තොරතුරු සන්නිවේදනය භාවිතා කිරීම දෙපාර්තමේන්තුවේ අඛණ්ඩ ප්‍රයත්නය වී ඇත. නිවැරදි තොරතුරු සඳහා ජනතාවගේ ප්‍රවේශය පුළුල් කිරීම මඟින් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීමේ ජාතික මෙහෙවරට ද දෙපාර්තමේන්තුව දායක වී ඇත.

මෙම ජයග්‍රහණ සහ ප්‍රගතිය පිටුපස කැපවීමෙන් කටයුතු කළ දෙපාර්තමේන්තුවේ සියලු නිලධාරීන්, මාධ්‍ය ආයතන, දේශීය හා විදේශීය මාධ්‍යවේදීන්, රාජ්‍ය ආයතන, සංවර්ධන හවුල්කරුවන් සහ මහජනතාව වෙත අපගේ කෘතඥතාවය පළ කරමු. ඔවුන්ගේ සහයෝගය සහ විශ්වාසය නොමැතිව මෙම ප්‍රගතිය ළඟා කරගැනීම දුෂ්කර කාර්යයක් විය හැකි බව අපි පිළිගනිමු.

අනාගතයේදී ද නවීන තාක්ෂණය, නව මාධ්‍ය ප්‍රවණතා සහ ජනතා අවශ්‍යතා සමඟ අනුගත වෙමින්, වඩාත් කාර්යක්ෂම, නවෝත්පාදනශීලී සහ ජනතා කේන්ද්‍රීය රාජ්‍ය තොරතුරු සන්නිවේදන පද්ධතියක් ගොඩනැඟීම සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව අඛණ්ඩව කැපවී කටයුතු කරනු ඇත. එමඟින් සියලු පුරවැසියන්ට නිවැරදි තොරතුරු ලබාගැනීමේ අයිතිය තහවුරු කරමින්, දැනුවත්, සවිබල ගැන්වුණු සහ සංවර්ධනය කෙරෙහි සක්‍රීයව සහභාගී වන සමාජයක් ගොඩනැඟීම සඳහා අඛණ්ඩව දායක වීම අපගේ අපේක්ෂාව සහ අධිෂ්ඨානය වේ.

******

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,
163, කිරුළපන ඇවනිව්, පොල්හේන්ගොඩ, කොළඹ 05.

அரசாங்க தகவல் திணைக்களம்
இல.163, கிருலப்பனை மாவத்தை, பொல்ஹேன்கொடை, கொழும்பு 05.

Department of Government Information
No.163, Kirulapone Avenue, Polhengoda, Colombo 05

www.dig.gov.lk www.news.lk